# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/53 - 2022 අප්‍රේල් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2022.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක 2187/27 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2022 අප්‍රේල් මස 28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2022 අප්‍රේල් මස 28 වන දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

1A - G 36704 - 370 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## අමාත්‍ය මණ්ඩල ව්‍යූහය

### අමාත්‍ය මණ්ඩල අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ

| | අමාත්‍යාංශ | | රාජ්‍ය අමාත්‍යාංශ |
|---|---|---|---|
| 01 | ආරක්ෂක | I<br>II | ආරක්ෂක<br>ආපදා කළමණාකරණ |
| 02 | තාක්ෂණ | | තාක්ෂණ |
| 03 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | | සංස්කෘතික හා ප්‍රාසාංග කලා |
| 04 | නාගරික සංවර්ධන හා නිවාස | I<br>II<br>III<br>IV | නාගරික සංවර්ධන<br>නිවාස<br>වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම්<br>වෙරළ සංරක්ෂණ |
| 05 | මුදල් | | |
| 06 | අධිකරණ | | බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන |
| 07 | විදේශ කටයුතු | | විදේශ කටයුතු |
| 08 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | I<br>II | ස්වදේශ කටයුතු<br>පළාත් සභා හා පළාත් පාලන |
| 09 | අධ්‍යාපන | I<br>II<br><br>III<br>IV | අධ්‍යාපන<br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා<br>උසස් අධ්‍යාපන<br>අධ්‍යාපන ප්‍රතිසංස්කරණ |
| 10 | සෞඛ්‍ය | I<br>II | සෞඛ්‍ය<br>දේශීය වෛද්‍ය |
| 11 | කම්කරු | | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ |
| 12 | පරිසර | | |
| 13 | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ | | |
| 14 | කෘෂිකර්ම | I<br><br>II<br>III | කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම<br>පශු සම්පත්<br>ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන |
| 15 | වාරිමාර්ග | I<br>II | වාරිමාර්ග<br>මහවැලි |
| 16 | ඉඩම් | | |
| 17 | ධීවර | | ධීවර |

| | අමාත්‍යාංශ | | රාජ්‍ය අමාත්‍යාංශ |
|---|---|---|---|
| 18 | වැවිලි කර්මාන්ත | I<br>II | වැවිලි<br>සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන |
| 19 | ජල සම්පාදන | | ජල සම්පාදන |
| 20 | විදුලිබල | | පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන |
| 21 | බලශක්ති | | |
| 22 | වරාය හා නාවික | | |
| 23 | මහාමාර්ග | I<br>II | මහාමාර්ග<br>ග්‍රාමීය මාර්ග සංවර්ධන |
| 24 | ප්‍රවාහන | | ප්‍රවාහන |
| 25 | තරුණ හා ක්‍රීඩා | | තරුණ හා ක්‍රීඩා |
| 26 | සංචාරක | | සංචාරක |
| 27 | වෙළඳ | I<br>II | වෙළඳ<br>සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ |
| 28 | කර්මාන්ත | I<br>II<br>III | කර්මාන්ත<br>පේෂ කර්මාන්ත හා දේශීය ඇගළුම් නිෂ්පාදන ප්‍රවර්ධන<br>මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත |
| 29 | ජනමාධ්‍ය | | |
| 30 | මහජන ආරක්ෂක | | |
| 31 | සමෘද්ධි සංවර්ධන | | |

**ජනාධිපති කාර්යාලය - ජාතික ප්‍රමුඛතා වැඩසටහන**

**01. විෂයපථය**

ඵලදායී ජනතා කේන්ද්‍රීය සේවා සැපයීමක් සහතික කිරීම සහ දිළිඳු බව තුරන් කරමින් සුරක්ෂිත රටක් ඇති කිරීම සඳහා ආර්ථික හා සාමාජීය වශයෙන් බලගැන්වීම පිණිස තිරසර ආයෝජනයන් සහිත උපාය මාර්ගික ප්‍රවේශයක් කරා ජාතික මට්ටමෙන් මග පෙන්වීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනාධිපති කාර්ය සාධක බලකායන්ගේ ද දායකත්වය ලබා ගනිමින් අදාළ අමාත්‍යාංශ හා සම්බන්ධීකරණය කරමින් සහ අදාළ අණපනත්වලට අනුකූලව පහත සඳහන් ව්‍යවස්ථාපිත ආයතනයන් හා අස්ථිත්වයන් ද, උක්ත කාර්ය සාධක බලකායන් ද, අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම.

**03. ජාතික ප්‍රමුඛතා**

01. ජාතික ආරක්ෂාව, කොවිඩ් -19 වසංගතය පැතිරීමේ අවදානම දුරු කිරීම, මත්ද්‍රව්‍ය පිටුදැකීම, පුරා විද්‍යා සංරක්ෂණය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, දිළිඳුකම පිටුදැකීම හා ආර්ථික පුනර්ජීවනය වෙනුවෙන් ඇති ජනාධිපති කාර්ය සාධක බලකායන් සමඟ සියළු අමාත්‍යාංශ, සිය විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම

02. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ජාතික සංවර්ධන වැඩසටහන තුළින් දිළිඳුකම පිටුදකිමින්, සියළු පාර්ශවවලට ප්‍රතිලාභ ලැබෙන අපනයන හා ආනයන ආදේශන නිෂ්පාදන ආර්ථිකයක් සඳහා දේශීය හා විදේශීය ආයෝජන පහසුකම් පුළුල් කිරීම

03. කොළඹ, හම්බන්තොට, යාපනය සහ ත්‍රිකුණාමලය බහුවිධ ජාතික සහ ජාත්‍යන්තර මධ්‍යස්ථාන ලෙසත්, මහනුවර, අනුරාධපුරය, ගම්පහ, රත්නපුරය, ගාල්ල, බදුල්ල, මන්නාරම, මඩකලපුව සහ කුරුණෑගල ජාතික මධ්‍යස්ථාන ලෙසත්, සංවර්ධනය කිරීම තුළින් සමස්ථ ජාතික ආර්ථික සංවර්ධනයට අවශ්‍ය වෙනත් සංවර්ධන කේන්ද්‍රස්ථාන පුළුල් කිරීම

**04. ආයතනික හා නෛතික රාමුව**

| ආයතන / අස්ථිත්වයන් | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව<br>3. සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>4. නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>5. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>6. දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇතිකිරීමේ ජනාධිපති කාර්යසාධක බලකාය<br>7. හරිත කෘෂිකර්මය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>8. එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>9. ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය | • මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)<br>• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11) |

1.0 ආරක්ෂක අමාත්‍ය

**01. විෂයපථය**

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රමුඛව ශ්‍රී ලංකාව ඒකීය ස්වෛරී රාජ්‍යයක් ලෙස ජනතා අභිලාෂයන් සුරක්ෂිත ලෙස තහවුරු කිරීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "සුරක්ෂිත රටක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
3. රටේ හමුදාමය ආරක්ෂාව මෙන්ම රාජ්‍යතාන්ත්‍රික ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව ද සහතික කරන අතර, අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා තබා ගැනීමට අවශ්‍ය සියළු කාර්යයන් ඉටු කිරීම
4. රාජ්‍ය හා පෞද්ගලික ආර්ථික ක්‍රියාවලින් මෙන්ම දෙස් විදෙස් ආයෝජන අවස්ථා පුළුල් කරන ආරක්ෂිත පරිසරයක් රට තුළ ඇති කිරීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. අභ්‍යන්තර කැරලි, ත්‍රස්තවාදී ක්‍රියා මැඩපැවැත්වීම හා බාහිර බලපෑම්වලින් ආරක්ෂා කිරීම.
2. මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වලක්වාලීම.
3. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය මෙරටට ඇතුළු වීම වැළැක්වීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීම වැළැක්වීම හා මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවූවන් පුනරුත්ථාපනය සඳහා අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය සමග ඒකාබද්ධව කටයුතු කිරීම.
4. ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුභ සාධනය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.
5. බහු කාර්ය සංවර්ධන කටයුතු සඳහා දිළිඳු පවුල්වල රැකියා හා ජීවනෝපාය දායකත්වය වැඩිවන අයුරින් දිළිඳු බව තුරන් කිරීමේ කාර්යයන් සඳහා මෙන්ම අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍ර සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය වෙත යොමු කිරීම.

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය<br>2. ශ්‍රී ලංකා යුද හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. රාජ්‍ය බුද්ධි සේවාව<br>6. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br>7. සර්ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>8. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය<br>9. ජාතික ශිෂ්‍යභට බලකාය<br>10. මිලෝදා ආයතනය (ACADEMY OF FINANCIAL STUDIES) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස<br>11. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>12. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව | • ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)<br>• යුධ හමුදා පනත (1949 අංක 17)<br>• නාවික හමුදා පනත (1950 අංක 34)<br>• ගුවන් හමුදා පනත (1949 අංක 41)<br>• වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත<br>• (2009 අංක 41)<br>• උදර්පණ නිතිය (1977 අංක 8)<br>• ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)<br>• පුපුරණ ද්‍රව්‍ය පනත (1956 අංක 21)<br>• ගිනි අවි ආඥා පනත (1916 අංක 33)<br>• වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත (1951 අංක 24)<br>• උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40)<br>• පීඩාකාරී අවි පනත (1966 අංක 18)<br>• මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9)<br>• ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)<br>• මහජන ආරක්ෂක ආඥා පනත (1947 අංක 25) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| | • ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68)<br>• ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත (1999 අංක 11)<br>• සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත (2000 අංක 42) |

## 1.1 ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

1. ආරක්ෂක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත “සුරක්ෂිත රටක්” ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. ත්‍රිවිධ හමුදා සේවයේ නියුතු, විශ්‍රාමික, මියගිය හා ආබාධිත අයවලුන්ගේ පවුල් සම්බන්ධයෙන් වන පරිපාලන, සැපයුම් හා සුබසාධන කටයුතු කිරීම.
2. ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම.

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>2. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>3. රක්නා ආරක්ෂණ ලංකා සමාගම<br>4. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය<br>5. අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය<br>6. ආරක්ෂක සේවා විද්‍යාලය<br>7. ජාතික ආරක්ෂක අරමුදල<br>8. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය<br>9. ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය<br>10. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතනය<br>11. රණවිරු සේවා අධිකාරිය<br>12. අපි වෙනුවෙන් අපි අරමුදල | • උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත (1951 අංක 17)<br>• උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)<br>• මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)<br>• නොතාරිස් ආඥාපනත (1907 අංක 1)<br>• ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)<br>• සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)<br>• භාර ආඥා පනත (1917 අංක 09)<br>• ඉඩම් (සන්තකය පැවරීමේ සීමා කිරීමේ) පනත (2014 අංක 38)<br>• මුද්දර පනත (2006 අංක 12)<br>• දඩ මුදල් වැඩි කිරීමේ පනත (2005 අංක 12)<br>• අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත (2017 අංක 05)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)<br>• ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ආඥාපනත (122 වන අධිකාරය) (1902 අංක 4)<br>• ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වන අධිකාරය) (1969 අංක 16)<br>• ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• කොන්සල් කර්තව්‍ය පනත (1981 අංක 04)<br>• මරණ ලියාපදිංචි කිරීමේ තාවකාලික පනත 2016 අංක 16) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| | • මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත (2010 අංක 19)<br>• හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21)<br>• ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>• පුරවැසි පනත (1948 අංක 18)<br>• ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>• අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>• අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>• රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත (2007 අංක 58)<br>• පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත (1998 අංක 45)<br>• මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)<br>• ඖෂධවලට අබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනුරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)<br>• ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)<br>• රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54)<br>• අපි වෙනුවෙන් අපි අරමුදල පනත (2008 අංක 6) |

1.2 **ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

ආරක්ෂක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සුරක්ෂිත රටක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ආපදා කළමනාකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ස්වාභාවික ආපදා අවදානම් කල්තබා හඳුනා ගැනීම, ආපදා වළක්වා ගැනීම, හානි අවම කිරීම හා හානිවූවන් නගා සිටුවීම කාර්යක්ෂම කිරීම සඳහා ආපදා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථාන හා සහන සේවා මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කරමින් ආයතනික ව්‍යුහයන් ශක්තිමත් කිරීම.
2. ආපදා තත්ත්වයන් පිළිබඳව නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන තාක්ෂණය සහ දැනුමින් කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව සවිමත් කිරීම.
3. ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක් වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියලු තොරතුරු ඇතුළත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම.

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව<br>2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>3. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය<br>4. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>5. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | • ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13) |

**2.0 තාක්ෂණ අමාත්‍ය**

**01. විෂයපථය**

ප්‍රශස්ත තොරතුරු තාක්ෂණය ජාතික සහ ජාත්‍යන්තර විද්‍යුත් සම්බන්ධතාවයන් හා සම්බන්ධීකරණය කරමින් සෞඛ්‍ය, අධ්‍යාපන, සුභ සාධන හා රාජ්‍ය සේවාවන් මෙන්ම ව්‍යාපාරික ක්ෂේත්‍රය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම සඳහා ඩිජිටල් ආණ්ඩුකරණ සේවා ස්ථාපිත කිරීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තාක්ෂණය මත පදනම් වූ ජාතියක්" බිහිකිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව තාක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. රාජ්‍ය යාන්ත්‍රණය, හා වෙළඳපළ ක්ෂේත්‍රයන්හි ක්‍රියාවලිය සරල කරමින් කාර්යක්ෂම හා ජනතා කේන්ද්‍රීය සේවා සැපයීම හා දැනුම් හුවමාරුවේ මෙවලමක් ලෙස තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් ඩිජිටල් ආණ්ඩුකරණය පුළුල් කිරීම.
2. දේශාන්තර විද්‍යුත් වාණිජ්‍යය සහ ජාත්‍යන්තර විද්‍යුත් ගෙවීම් ක්‍රම ස්ථාපනය.
3. රට පුරා විහිදුනු අධිවේගී දත්ත හුවමාරු පද්ධතියක් හා ආශ්‍රිත ජංගම ජාල පද්ධතිය ස්ථාපනය කිරීම.
4. දත්ත ආරක්ෂණ, සයිබර් ආරක්ෂාව, බුද්ධිමය දේපල අයිතිය සඳහා නව නීති හා ආයතනික ව්‍යුහය සකස් කිරීම.
5. පරිසර සංවේදිතාව, තොරතුරු තාක්ෂණය, දැනුම හා නිපුණතා, සෞඛ්‍ය, සංචාරක සේවා හා ක්‍රීඩා ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ සුවිශේෂත්වය මතු කරමින් ඩිජිටල් ආණ්ඩුකරණය හා ආයතනික ව්‍යුහය සඳහා අවශ්‍ය නීති පද්ධතිය හා නියාමක ව්‍යුහය හඳුන්වා දීම.
6. තාක්ෂණ ක්ෂේත්‍රයේ අපනයන දායකත්වය හා ජාතික ආර්ථිකයේ දැනුම හා වෘත්තීය සේවා දායකත්වය පුළුල් වන අයුරින් ව්‍යවසාය සංවර්ධනය, තාක්ෂණික යටිතල පහසුකම් හා ආශ්‍රිත සේවාවන් පුළුල් කිරීම මගින් තාක්ෂණික ව්‍යවසාය ආර්ථිකයක් සඳහා පරිවර්තනය කිරීම.
7. තාක්ෂණය කේන්ද්‍ර කරගත්, ආයෝජන, ව්‍යාපාර, ව්‍යවසායකත්වය හා ආශ්‍රිත සේවා කර්මාන්ත සඳහා පරිවර්ථනයක් (transition) මගින් තාරුණ්‍යයකට ඉහළ ආදායම් උත්පාදනය කළ හැකි රැකියා නිර්මාණය කිරීම සඳහා තාක්ෂණ උද්‍යාන (Techno Park) ඇති කිරීම.

**04. ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන<br>2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන<br>3. ශ්‍රී ලංකා පරිඝණක හදිසි ප්‍රතිචාර සංසදය<br>4. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන<br>5. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>6. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>7. ටෙක්නො පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් | • ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)<br>• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br>• ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br>• පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32) |

**2.1 තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

තාක්ෂණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත "තාක්ෂණය මත පදනම් වූ ජාතියක්" බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව තාක්ෂණ විෂයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනයට සහයවීම, ජාතික අයවැය , රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම මඟින් විදේශ ආදායම් ඉපදවීම සහ ඉහල ආදායම් සහිත රැකියා සඳහා තරුණ තරුණියන්ට යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථාව පුළුල් කිරීම.

**03. ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු,ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. කාර්මික තාක්ෂණ ආයතනය<br>2. ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>4. ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>5. තොරතුරු තාක්ෂණ උද්‍යාන (යාපනය සහ මන්නාරම) | • විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6) |

**3.0 බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය**

**01. විෂයපථය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුද්ධාගමට හිමි ප්‍රමුඛතාවය තුළ බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කරමින්, අනෙකුත් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂක කිරීම හා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා කටයුතු කිරීම හා ශ්‍රී ලාංකීය ප්‍රෞඪත්වය හා අනන්‍යතාවය ස්ථාපිත කරමින් ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍ය, කලාව ආදී සංස්කෘතිමය විහිදීම් සංරක්ෂණය කිරීම හා උසස් රසඥතාවයක් උදෙසා එම අංශයන්හි ධනාත්මක ප්‍රගමනය තහවුරු කිරීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බුද්ධශාසනයේ ප්‍රමුඛත්වය සුරක්ෂිත කරමින් "සියලු ආගම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම"සහ "සංස්කෘතික හා කලා නිර්මාණ අනාගත පරපුරට උරුම කර දීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. සියලු ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සහ ආගමික අන්තවාදයට එරෙහිව පියවර ගැනීම.
3. සෑම පුරවැසියෙකුටම බියෙන් සැකෙන් තොරව තම ආගම ඇදහීමේ අයිතිය සහතික කිරීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථානවලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා "සසුන් උදාව" ජාතික වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

2. ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීති අණ පනත් සුදුසු පරිදි සංශෝධනය කිරීම
3. මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කොට එය සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය පදනම සකස් කිරීම
4. ජනාධිපති කාර්ය සාධක බලකාය හා ඒකාබද්ධව පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය හා නීතිමය පසුබිම සකස් කිරීම
5. සියලු ආගම්වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම
6. දහම් පාසැල් කටයුතු පුළුල් කිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම
7. නැගෙනහිර පළාත් තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය
8. ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව<br>2. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>3. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව<br>4. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>5. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>6. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව<br>7. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව<br>8. එස්. ඩබ්ලිව්.ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම<br>9. ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය<br>10. මහා භාරකාර දෙපාර්තමේන්තුව<br>11. මධ්‍යම සංස්කෘතික අරමුදල<br>12. බුද්ධ ශාසන අරමුදල<br>13. බෞද්ධ පුනරුද අරමුදල<br>14. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | • බුද්ධ ශාසන අරමුදල පනත (1990 අංක 35)<br>• විහාර දේවාලගම් ආඥාපනත (1931 අංක 19)<br>• හින්දු සංස්කෘතික අරමුදල පනත (1985 අංක 31)<br>• මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)<br>• එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනත ( 1981 අංක 48)<br>• සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)<br>• ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)<br>• ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)<br>• මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)<br>• මහා භාරකාර ආඥාපනත (1922 අංක 01)<br>• පුරාවස්තු ආඥා පනත (1940 අංක 9)<br>• ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනත (1988 අංක 77) |

**3.1** සංස්කෘතික හා ප්‍රාසාංග කලා රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහල ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සංස්කෘතික හා ප්‍රාසාංග කලා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම.
2. දේශීයත්වය මුල්කර ගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
3. අංග සම්පූර්ණ "නාට්‍ය නිකේතනයක්" ස්ථාපිත කිරීම හා කලාකරුවන් ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම.
4. කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශනය සඳහා විශේෂිත පහසුකම් සැලසීම.

5. සාම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවල් සංචාරක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ටවර්හෝල් රඟහල පදනම<br>2. ජාතික කලා මණ්ඩලය<br>3. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය<br>4. ගාලු උරුමය පදනම<br>5. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය<br>6. ජාතික ප්‍රසංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)<br>7. අපේ ගම - කාර්යාල පරිශ්‍රය හැර<br>8. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය<br>9. ජාතික චිත්‍රපටි සංස්ථාව | • ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)<br>• සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)<br>• ගාලු උරුමය පදනම පනත (1994 අංක 7)<br>• රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47) |

## 4.0. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

**01.** විෂයපථය

භෞතික අවකාශයේ නව ප්‍රවේශයක් හරහා ආර්ථික කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙන්ම, සුවපහසු, සුපිරිසිදු නගර ඇති කිරීම සහ ජනතාවට අැවැසි නේවාසික හා නාගරික පහසුකම් ලබා දීම.

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත "නව නගර හා සැමට නිවාස" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව නාගරික සංවර්ධන හා නිවාස විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. නාගරික සංවර්ධනය කේන්ද්‍රකරගත් බහුවිධ කුසලතා සහිත රැකියා, ව්‍යාපාර හා ආදායම් මාර්ග පුළුල් කිරීම
2. දේශීය ඉදිකිරීම්කරුවන් සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාව ලබා දීම
3. ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
4. කම්කරු ශ්‍රම ඌනතාවය සඳහා හැකිතාත් තාක්ෂණික විසඳුම් කරා යොමුවීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම
5. පුහුණු කම්කරුවන් බිහිකිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කුසලතා දියුණු කිරීමට වෘත්තීමය අධ්‍යාපනය වෙළඳපල අවශ්‍යතාවය අනුව සම්බන්ධීකරණය
6. ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපදේශන පහසුවෙන් ලබා ගැනීම සඳහා දේශීය වෘත්තීය ඉංජිනේරුවන් සහ උසස් තාක්ෂණවේදීන්ගේ දායකත්වය ලබා ගැනීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය සලකුණ ජාත්‍යන්තර තලයේ සන්නාමයක් බවට පත්කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කර ගැනීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන් ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සමග පහසුවෙන් කටයුතු කිරීමේ සම්බන්ධීකරණ යන්ත්‍රණයක් හඳුන්වා දීම
7. උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසෙන නීති පනත් සම්මත කර දේශීය සුළු සහ මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව<br>2. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143) | • නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (1946 අංක 13) |

**4.1** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව නගර හා සුපිරිසිදු රටක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නාගරික සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ සංවර්ධනය මගින් නාගරික ශ්‍රම බලකාය සමාජීය වශයෙන් සවිබල ගැන්වීම
2. කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල මැදි ආදායම්ලාභීන් සඳහා නවීන පහසුකම් සහිත නිවාස සංකීරණ සඳහා දිගුකාලීන ණය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය
3. ගංවතුර පාලනය, නාගරික රථගාල්, සාප්පු සංකීර්ණ, ශරීර සුවතා, විනෝදාශ්වාද පහසුකම් සැපයීම
4. පැරණි මහල් නිවාස, නව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම
5. නාගරික පැල්පත්වාසීන් සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නවීන නිවාස ලබා දීම හා ප්‍රජා පහසුකම් ලබාදීම
6. මධ්‍යම පාන්තිකයින් ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති හා ණය පහසුකම් සැලසීම
7. කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම
8. නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබා දීම මගින් නව නිවාස ව්‍යාපෘති සඳහා අයෝජකයන් දිරිමත් කිරීම
9. නාගරික වන උයන්, නාගරික හා අර්ධ නාගරික උද්‍යාන, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වා දීම
10. නාගරික අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
11. පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගන හා සනීපාරක්ෂක කසල රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසල බැහැර කිරීම් වළක්වාලීමට කටයුතු සම්පාදනය කිරීම
12. රෝහල් සහ කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුගත වන පරිදි නීති ක්‍රමවේදයන් සකස් කිරීම
13. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැලැක්වීමට පියවර ගැනීම
14. සියළුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූල ව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම
15. සියළු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම ව්‍යාපෘතියේ මූලික කොටසක් ලෙස සැලකීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, වස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. නාගරික සංවර්ධන අධිකාරිය<br>2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය<br>3. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)<br>4. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | • නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41)<br>• නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2)<br>• නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (2008 අංක 36)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන පනත (2018 අංක 23)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)<br>• පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10) |

**4.2 නිවාස රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සැමට නිවාස හා තිරසර ඉදිකිරීම්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නිවාස විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. අවතැන්වූවන්ට ග්‍රාමීය නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම වැළැක්වීම සඳහා එක් ස්ථානයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ සියළු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම
3. ඉදිකිරීම් කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවතින බලපත්‍ර ලබාදීම ක්‍රමවේදය සරල කිරීම
4. ගංවතුරෙන් තොර වාසස්ථාන ඇතිකිරීම හා පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරගත් පහත්බිම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>2. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව<br>3. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>4. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව<br>5. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය<br>6. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව<br>7. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය<br>8. ඕෂන් විව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>9. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් | • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17)<br>• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)<br>• ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත (1968 අංක 15) |

## 4.3 වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "පහසුකම් පිරි ගමක් හා සමෘද්ධිමත් වතු ප්‍රජාවක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම
2. වතු ප්‍රජාව ආශ්‍රිතව නිවාස හා මූලික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
3. වතු ආශ්‍රිත අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස යෝජනා ක්‍රම වතු හිමියන් ගේ ද දායකත්වය සහිතව හඳුන්වා දීම සහ මෙම නිවාස යෝජනා ක්‍රමය තුළ අංග සම්පූර්ණ සෞඛ්‍ය මධ්‍යස්ථාන, පෙර පාසැල් සහ ප්‍රජා ශාලා ඇතුළු පහසුකම්ද ස්ථාපිත කිරීම
4. වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය<br>2. වැවිලි මානව සංවර්ධන භාරය<br>3. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම<br>4. වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල | • වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය පනත (2018 අංක 32)<br>• සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පනත (2005 අංක 19) |

## 4.4 වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වෙරළ සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම .

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. සමුද්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වාදීම
2. සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම
3. ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මුහුදු තීරයට සහ මුහුදු පත්ලට සිදු වී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br>2. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | • සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35)<br>• වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57) |

**5.0** මුදල් අමාත්‍ය

**01. විෂයපථය**

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, වාර්ෂික අයවැය හා විසර්ජන පනත් සම්බන්ධ වගකීම්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය හා විදේශීය ඉතුරු කිරීම් හා ආයෝජන, රාජ්‍ය ණය, බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා, සමාජ ආරක්ෂණ සහ ආර්ථික සංවර්ධන කටයුතු මෙහෙයවීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව මුදල් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා පෞද්ගලික අංශ යොමු කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. සැමට ප්‍රතිලාභ විහිදෙන, සියළු පළාත් ආවරණය වන, ආදායම් විෂමතා අවම වන, තිරසර ඉහළ ආර්ථික වර්ධන වේගයක් ඇති කර ගැනීම
2. අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩුකර ගැනීම හා ඒක පුද්ගල ආදායම ඉහල නංවා ගැනීම
3. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුල මිල ස්ථාවරත්වය ඇති කිරීම
4. අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩු කර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාවයන් අවම කිරීම
5. ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුලින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම
6. රුපියලේ අගය ස්ථාවරත්වය තහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම
7. දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම
8. පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම
9. රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම
10. රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම
11. ඉතුරුම් හා ආයෝජන දිරි ගැන්වෙන පරිදි බැංකු, මූල්‍ය ආයතන ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
12. බිඳවැටී ඇති මූල්‍ය ආයතන ව්‍යාපාර නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
13. කෘෂිකර්මය, ඉදිකිරීම් ක්ෂේත්‍රය,තොරතුරු තාක්ෂණ කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංචාරක සහ අපනයන අංශ දියුණු කිරීම සඳහා ජාතික සංවර්ධන,මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ වැඩසටහන් සම්බන්ධීකරණය හා පුළුල් කිරීම
14. බැඳුම්කර හා කොටස් වෙළඳපළ ආකර්ශණීය කරවීම
15. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ප්‍රාථමික වෙළඳපළ ප්‍රතිසංස්කරණ හා නියාමන කටයුතු ශක්තිමත් කිරීම
16. අන්තර් ජාතික ව්‍යාපාර ප්‍රමුඛයන් (International Business Giants) ගේ ව්‍යාපාරික ආයතන වල ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය ආශ්‍රිතව ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම
17. විදේශ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පෞද්ගලික අංශයේද සහය ඇතිව සෞභාග්‍යයේ දැක්ම නව ආර්ථික සැලැස්ම ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණ වැඩපිළිවෙල දියත් කිරීම

18. මහා පරිමාණ දේශීය ආයෝජකයින්ට අධිතාක්ෂණික නිෂ්පාදන (High Technology Products) ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම
19. දේශීය ව්‍යාපාරිකයන්ට තරගකාරීව නිසි ලෙස ව්‍යාපාර ක්ෂේත්‍රවලට විදේශ ආයෝජන ප්‍රවේශ නියාමනය හා දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඔවුන්ව සවිබල ගැන්වීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
20. රාජ්‍ය ව්‍යාපාර ආර්ථික හා සමාජීය වශයෙන් ජාතික ආර්ථිකයේ කරනු ලබන දායකත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් ඒවායේ මූල්‍ය ශක්තිය වැඩිකිරීම.
21. “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
22. ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
23. ආර්ථික සංවර්ධනයේ දී පෞද්ගලික අංශයේ සහභාගීත්වය පහසුකරලීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා සමූපාකාර ක්ෂේත්‍රය සම්බන්ධීකරණය
24. ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම
25. යටිතල පහසුකම් සංවර්ධන, ආයෝජන ප්‍රවර්ධන, කාබනික පොහොර නිෂ්පාදනය නියාමනය ඇතුළු රජයේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක වෙත මෙහෙයවීම සඳහා සියලු අමාත්‍යාංශ හා අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය
26. බිම් මට්ටමෙහි සේවා සැපයුම් ජාලය ශක්තිමත් කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහා ජාත්‍යන්තර බැංකු, අරමුදල් හා දේශීය බැංකු ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. භාණ්ඩාගාර කටයුතු<br><br>i. මහා භාණ්ඩාගාරය<br>ii. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව<br>iii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>iv. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>v. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>vi. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>vii. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව<br>viii. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>ix. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව<br>x. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>xi. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>xii. නීති කටයුතු දෙපාර්තමේන්තුව<br>xiii. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව<br>xiv. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br>xv. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය<br>xvi. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>xvii. ජාතික මෙහෙයුම් මැදිරිය<br>xviii. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | • විසර්ජන පනත්<br>• රේගු ආඥාපනත (1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත (2010 අංක 17)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)<br>• සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)<br>• මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)<br>• මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)<br>• දේශීය ආදායම් පනත (2017 අංක 24)<br>• රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)<br>• ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)<br>• දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)<br>• ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)<br>• සමාගම් පනත (2007 අංක 7)<br>• පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)<br>• ව්‍යාපාර නාම පනත (1987 අංක 7)<br>• වෙළඳ සළකුණු පනත (1964 අංක 30) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 2. **රාජ්‍ය ආදායම් කළමනාකරණ කටයුතු**<br><br>i. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>ii. ශ්‍රී ලංකා රේගුව<br>iii. සුරාබදු දෙපාර්තමේන්තුව<br>iv. ජාතික ලොතරැයි මණ්ඩලය<br>v. සංවර්ධන ලොතරැයි මණ්ඩලය<br>vi. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br>vii. තක්සේරු දෙපාර්තමේන්තුව<br>viii. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය<br>ix. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව<br><br>3. **බැංකු මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපළ ප්‍රතිපත්ති හා නියාමන කටයුතු**<br><br>i. ශ්‍රී ලංකා මහ බැංකුව<br>ii. සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන<br>iii. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>iv. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>v. ණය තොරතුරු කාර්යාංශය<br>vi. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>vii. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>viii. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br>ix. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව<br>x. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව<br>xi. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br><br>4. **සංඛ්‍යාලේඛන තොරතුරු හා අධ්‍යයන කටයුතු**<br><br>i. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>ii. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය<br>iii. තිරසර සංවර්ධන සභාව<br><br>5. **සුභසාධන හා සමාජ ආරක්ෂණ කටයුතු**<br><br>i. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය<br>ii. රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර සංගමය<br><br>6. **අරමුදල් කළමනාකරණය**<br><br>i. ලෝහෝර් ආර්යා අරමුදල<br>ii. වර්ජන, කෝලහාල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල<br>iii. ජාතික රක්ෂණ භාර අරමුදල<br>iv. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | • සීට්ටු ආඥාපනත (1935 අංක 61)<br>• මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)<br>• ආනයන හා අපනයන (පාලන) පනත (1969 අංක 1)<br>• මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)<br>• මුද්දර ගාස්තු පනත (1982 අංක 43)<br>• එකතු කළ අගයමත බදු පනත (2002 අංක 14)<br>• මුදල් පනත (1971 අංක 38)<br>• පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)<br>• බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)<br>• සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)<br>• ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)<br>• මුදල් නීති පනත (1949 අංක 58)<br>• ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30)<br>• මහජන බැංකු පනත (1961 අංක 29)<br>• ලංකා බැංකු ආඥාපනත (1938 අංක 53)<br>• බැංකු පනත (1988 අංක 30)<br>• බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 4)<br>• ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)<br>• ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)<br>• නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත<br>• ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (1937 අංක 07)<br>• ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත (2005 අංක 28)<br>• මුදල් ව්‍යාපාර පනත (2011 අංක 42)<br>• විදේශ විනිමය පනත (2017 අංක 12)<br>• රක්ෂණ සංස්ථා පනත (1961 අංක 02)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත (1990 අංක 18)<br>• දාෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9)<br>• ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| v. ශ්‍රම වාසනා අරමුදල<br>vi. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල<br>vii. වකුගඩු අරමුදල<br>viii. තේ ශක්ති අරමුදල<br>ix. කප්රුක අරමුදල<br>x. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල<br>xi. දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>xii. තුරුසවිය අරමුදල<br><br>**7. ඇවර කිරීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට නියමිත ආයතන**<br><br>i. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව<br>ii. වනජීවී භාරය<br>iii. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය<br>iv. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව<br>v. මාශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය<br>vi. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්<br>vii. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල<br>viii. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතන | • ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)<br>• නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7)<br>• ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත (2008 අංක 41)<br>• ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත (2019 අංක 12)<br>• වරලත් ගණකාධිකාරී ආයතනය පනත (1959 අංක 23)<br>• සංගණන ආඥා පනත (143 අධිකාරිය)<br>• ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත (1988 අංක 53)<br>• තිරසර සංවර්ධන පනත (2017 අංක 19)<br>• ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත (1995 අංක 15)<br>• ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත (2002 අංක 35)<br>• සුභසාධක ප්‍රතිලාභ පනත (2002 අංක 24)<br>• රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත (1891 අංක 5)<br>• ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (2008 අංක 14) |

**6.0 අධිකරණ අමාත්‍ය**

**01. විෂයපථය**

ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වය තබා ක්‍රියාත්මක කරන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු හා නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරමින්, නීතිය වෙත ප්‍රවිෂ්ය වන හා නීතියේ රැකවරණය සැමට සර්ව සාධාරණ වන සේ කටයුතු කිරීම උදෙසා නෛතිකමය පසුබිම සකස් කිරීම හා භෞතික පහසුකම් සලසාලීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුකර ඇති ව්‍යාකූලතාවයන් නිවැරදි කරමින් ජනතා පරමාධිපත්‍ය තහවුරු වන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හා "නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම සඳහා" අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධිකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම .

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යාකූලතාවයන් ඉවත් කරමින් ජනතා පරමාධිපත්‍ය, ජාතික ආරක්ෂාව, සියලු පාර්ශව ආවරණය වන ආර්ථික සංවර්ධනය, මානව හිමිකම් හා නීතියේ ආධිපත්‍ය සහ රටේ ස්වෛරීත්වය ආරක්ෂාවන ව්‍යවස්ථා සංශෝධනය කිරීම.

2. රටේ නීතිය, ජාත්‍යන්තර නීතිය සමග ජාතික අනන්‍යතාවය හා ස්වෛරීත්වය රැකෙන පරිදි අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම
3. යල්පැනගිය නීති, ක්‍රියාපටිපාටි හා අණපනත් සංශෝධනය සඳහා සියලුම ආයතන සම්බන්ධීකරණයෙන් වැඩපිළිවෙළක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
4. අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය හා අධිකරණ පද්ධතියේ ප්‍රමාදයන් වළක්වාලීම සඳහා නවීන තාක්ෂණයේ උපයෝගීතාවය ද යොදා ගනිමින් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම
5. සිවිල් ආරවුල්, අධිකරණය දක්වා නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම
6. නීතිය ක්‍රියාක්මක කිරීමේ පටිපාටි සහ යාන්ත්‍රණය පිළිබඳ අදාළ පුද්ගලයන්ට අවශ්‍ය නවීන දැනුම හා තාක්ෂණික පුහුණුව ලබා දීම
7. අධිකරණ පද්ධතිය සහ ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම සඳහා තොරතුරු තාක්ෂණ ආයතන සමග සම්බන්ධීකරණය

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාක්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. නීතිපති දෙපාර්තමේන්තුව<br>2. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br>3. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව<br>4. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව<br>5. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය<br>6. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව<br>7. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය<br>8. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම<br>9. සමථ මණ්ඩල කොමිෂන් සභාව<br>10. නීති අධ්‍යාපන සභාව<br>11. ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය<br>12. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්‍රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්<br>13. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය<br>14. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය<br>15. හානිපූරණය සඳහා වන කාර්යාලය<br>16. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | • උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය පනත (1987 අංක 50)<br>• ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත (2001 අංක 10)<br>• නීති අධ්‍යාපන මණ්ඩල සභා පනත (1974 අංක 6)<br>• ණය සහනදායක ආඥාපනත (1941 අංක 39)<br>• විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත (1956 අංක 15)<br>• ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනත (1988 අංක 69)<br>• පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 19)<br>• සමායතන නීතිඥ ආයතන නීතිය (1978 අංක 33)<br>• අධිකරණ සංවිධාන පනත (1978 අංක 2)<br>• උසාවි භාෂා පනත (1961 අංක 3)<br>• ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පනත (1985 අංක 46)<br>• නීති කොමිෂන් සභා පනත (1969 අංක 3)<br>• නීති ආධාර පනත (1978 අංක 11)<br>• සමථ මණ්ඩල පනත (1988 අංක 72)<br>• වංචා වැළැක්වීමේ ආඥාපනත (1840 අංක 7)<br>• සමාජ අබලතා වැළැක්වීමේ පනත (1957 අංක 21)<br>• ප්‍රාථමික අධිකරණ සංවිධාන පනත (1979 අංක 44)<br>• රාජ්‍ය (සිවිල් වරදෙහිලා වගකීම්) පනත (1969 අංක 22)<br>• අපරාධ වැළැක්වීමේ ආඥාපනත (1926 අංක 2)<br>• ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීමේ) පනත<br>• අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)<br>• ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත (2000 අංක 44)<br>• අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14)<br>• හානිපූර්ණය සඳහා වන කාර්යාල පනත (2018 අංක 34) |

**6.1 බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය**

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියා තුරන් කිරීම සඳහා පියවර ගැනීම
2. ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම
3. බන්ධනාගාරය තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම
4. සිරකරුවන්ගේ තදබදය අඩු කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම
5. සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීම
6. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සේවක පරිපාලන ගැටලු කඩිනමින් විසඳීම

**03. අදාළ ආයතන හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත් |
|---|---|
| 1. බන්ධනාගාර දෙපාර්තමේන්තුව<br>2. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව<br>3. තරුණ වරදකරුවන්ගේ විශෝධන පුහුණු පාසැල<br>4. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය | • බන්ධනාගාර ආඥාපනත (1877 අංක 16)<br>• තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)<br>• ප්‍රජා පාදක විශෝධන පනත (1999 අංක 46) |

**7.0 විදේශ කටයුතු අමාත්‍ය**

**01. විෂයපථය**

මිත්‍රශීලී හා නොබැඳුණු විදේශ ප්‍රතිපත්තියක් මත ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කරමින් සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතිකමය වපසරියන් තුළ ද්වි පාර්ශ්වික හා බහුපාර්ශ්වික සබඳතා ඔස්සේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ඔසවා තැබීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "මිත්‍රශීලී සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් අන් රටවල් හා සම මිතුරු සබඳතා පවත්වා ගැනීම

2. මෙතෙක් ඇතිකරගෙන ඇති ද්විපාර්ශවීය ගිවිසුම් නැවත සමාලෝචනයට ලක් කොට රටට අහිතකර කොන්දේසි සම්බන්ධයෙන් නැවත සළකා බැලීම හා ගිවිසුම්වලට එළඹීමේ දී දේශීය ආර්ථිකයට හානිකර නොවන පසුබිමක් සකස් කිරීම
3. විදේශ දූත මණ්ඩල තෝරා ගැනීමේදී රටේ විදේශීය ප්‍රතිපත්තියට අනුකූල ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්ය ඉටු කිරීමට දායක වන නිර්ණායකයන් අනුව කටයුතු කිරීම හා දූත මණ්ඩල මගින් අපේක්ෂිත අරමුණු ඉටු වීම පිළිබඳ අඛණ්ඩ ඇගයීමට ලක් කිරීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල<br>2. ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා ලේකම් කාර්යාලය<br>3. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය | • කොන්සල් කර්තව්‍ය පිළිබඳ පනත (1981 අංක 4)<br>• රාජ්‍ය දූත වරප්‍රසාද පනත (1996 අංක 9)<br>• ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත (1980 අංක 31) |

7.1 **විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

විදේශ කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත “මිත්‍රශීලී සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය” ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ආසියානු රටවල් සමග ශක්තිමත් ආර්ථික හා වෙළඳ සබඳතා පුළුල් කර ගැනීම
2. සාර්ක් හා බිම්ස්ටෙක් රටවල් සමග සමීප සබඳතා ශක්තිමත් කිරීම
3. මැදපෙරදිග හා ගිනිකොණ දිග ආසියාතික රටවල් සමග වෙළඳ, සංචාරක හා ආයෝජන හා රැකියා වෙළඳපොල සබඳතා ඇතිකර ගැනීම
4. දේශීය කර්මාන්තකරුවන් සහ සම්ප්‍රදායික සංස්කෘතික නිර්මාණ හා දේශීය නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපල අවස්ථා නිර්මාණය සඳහා කටයුතු කිරීම
5. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට විදේශ රටවල ඇති භාණ්ඩ හා සේවා වෙළඳපළ සඳහා ඇති විවිධ බාධා ඉවත් කිරීමට සෘජු දායකත්වය ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවේ ආයෝජන හා සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් එම රටවල් දායක කර ගැනීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | • උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත (2000 අංක 45) |

**8.0** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

**01. විෂයපථය**

සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ත සේවාවක් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවා සැපයීමක් ලබා දීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන පිරිස් කළමනාකරණය
3. පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. රාජ්‍ය සේවාව කඩිනම් කිරීම සඳහා දැනට රාජ්‍ය අංශයේ පවත්නා සියලුම චක්‍රලේඛ විධිවිධාන, නීති හා රෙගුලාසි, සමාලෝචනයට ලක් කොට සරල කිරීම
2. ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම සඳහා අවශ්‍ය නීතිමය, ප්‍රතිපත්තිමය හා ආයතනික රාමුව සකස් කිරීම
3. ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නව සේවා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම
4. රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සංස්ථා සහ බැංකු සේවයේ සියලුම ආයතනවල සත්භාවයෙන් යුක්තව රාජකාරියේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය හිමි වන පරිදි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම
5. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප ලබා දීම
6. සේවා සමාලෝචනයක් සිදු කොට, අවශ්‍ය පරිදි නව සේවා ව්‍යවස්ථා හඳුන්වාදීම හා යාවත්කාලීන කිරීම
7. රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර ක්‍රියාවලියක් හඳුන්වාදීම
8. රාජ්‍ය සේවයේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව දීර්ඝ කාලීන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
9. සංස්ථා, අර්ධ රාජ්‍ය, බැංකු සහ පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථසාධක අරමුදලට අමතරව දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම
10. රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
11. මහජන හිතෛෂී සේවාවක් උදෙසා රාජ්‍ය සේවය තුළ තොරතුරු තාක්ෂණ මෙවලම් උපයෝජනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ තාක්ෂණික ධාරිතාවය පුළුල් කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය<br>3. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්<br>4. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>5. රාජ්‍ය භාෂා කොමිසම<br>6. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව<br>7. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | • වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත (1983 අංක 24)<br>• වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත (1898 අංක 1)<br>• වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1998 අංක 60)<br>• වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1970 අංක 18)<br>• රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 අංක 40) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| | • රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත (1942 අංක 18)<br>• පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල (1974 අංක 16)<br>• පළාත් පාලන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල (1974 අංක 16)<br>• පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල (1974 අංක 16)<br>• විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය<br>• පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත (1953 අංක 44)<br>• පළාත් සභා විශ්‍රාම වැටුප් පනත (1993 අංක 17)<br>• රජයේ හා අධිකරණ සේවා නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ ආඥාපනත (1910 අංක 11)<br>• යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• අනිවාර්ය රාජ්‍ය සේවා පනත (1961 අංක 70)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත (1982 අංක 9)<br>• රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීම) පනත (1969 අංක 7)<br>• තෑගි පිරිනැමීමේ තරහ පනත (1957 අංක 37)<br>• රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)<br>• රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18))<br>• ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18)<br>• ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)<br>• පිරිවෙන් අධ්‍යාපන පනත (1979 අංක 64)<br>• පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය)<br>• පළාත් සභා ඡන්ද විමසීම් පනත (1988 අංක 2) |

**8.1 ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත ''රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්''ඇති කිරීම සඳහා අදාළ අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ස්වදේශ කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම
2. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරනු ලබන ජනතා කේන්ද්‍රීය සේවාවන් ශක්තිමත් කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | • බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)<br>• නිවාඩු පනත (1971 අංක 29)<br>• ප්‍රධාන මුලාදෑනීතැන තනතුර වෙනස් කිරීමේ පනත (1941 අංක 11)<br>• ගම්මුලාදෑනී තනතුර වෙනස් කිරීමේ පනත (1964 අංක 6)<br>• පදවි නාම සංශෝධනය කිරීමේ පනත (1977 අංක 5)<br>• පදවි නාම වෙනස් කිරීමේ පනත (1993 අංක 2) |

**8.2** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය

**01.** **කාර්යයන් හා කර්තව්‍යයන්**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව හා පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ සේවාවන් ප්‍රාදේශීය මට්ටමෙන් ජනතා කේන්ද්‍රීයව ඉටු කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, බල ගැන්වීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** **සුවිශේෂී ප්‍රමුඛතා**

1. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සේවා ද්වීකරණය වැළැක්වීම සඳහා එවැනි අවස්ථා අධ්‍යයනය කොට එම තත්ත්වය වළක්වාලීම සඳහා විශේෂ ක්‍රමවේදයක් හඳුන්වා දීම
2. පළාත් පාලන හා පළාත් සභා බල ප්‍රදේශවල ග්‍රාමීය හා දුෂ්කර ගම්වලට මුල්තැන දෙමින් ප්‍රාථමික පාසැල්, රෝහල්, මාතෘ නිවාස, වැඩිහිටි හා ළමා නිවාස සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ විශේෂ ව්‍යාපෘති අදාළ ආයතන සමඟ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
3. පළාත් සභා හා පළාත් පාලන කෘෂි මාර්ග, ග්‍රාමීය මාර්ග, හා පළාත් මාර්ග ලක්ෂයේ වැඩසටහන හා ජාතික මට්ටමේ මාර්ග පද්ධතියට සම්බන්ධ කෙරෙන අයුරින් සංවර්ධන කිරීම සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරීන් සමඟ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | • පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත (1999 අංක 31)<br>• මහනගර සභා ආඥා පනත (52 අධිකාරිය)<br>• ප්‍රාදේශීය සභා පනත (1987 අංක 15)<br>• නගර සභා ආඥාපනත (255 අධිකාරිය)<br>• පළාත් සභා පනත (1987 අංක 42)<br>• පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)<br>• දේශීය ණය සංවර්ධන අරමුදල පනත (1916 අංක 22) |

**9.0** අධ්‍යාපන අමාත්‍ය

**01.** **විෂයපථය**

දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන, නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කරදීම.

**02.** **කාර්යයන් හා කර්තව්‍යයන්**

1. “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “දැනුමෙන් පිරිපුන් සමාජයක්” බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්යය සාධක බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම.

**03.** **සුවිශේෂී ප්‍රමුඛතා**

1. පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
2. සැම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීමට සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම
3. පාසල් ගුරුවරුන්ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම
4. පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම
5. ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම
6. විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**04.** **අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ<br>2. ගුරු විද්‍යාල<br>3. විභාග දෙපාර්තමේන්තුව<br>4. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම<br>5. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව<br>6. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය<br>7. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>8. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව<br>9. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල<br>10. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය<br>11. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | • ප්‍රසිද්ධ විභාග පනත (1968 අංක 25)<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත - 1960 අංක 05<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත (1961 අංක 08)<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත (1981 අංක 65)<br>• ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩල පනත (1988 අංක 51)<br>• පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 8)<br>• යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)<br>• රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)<br>• අධ්‍යාපන ආඥා පනත (1939 අංක 31)<br>• අධ්‍යාපන විද්‍යායතන පනත (1986 අංක 30)<br>• ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)<br>• ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත (1991 අංක 19) |

**9.1** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. අධ්‍යාපන සුදුසුකම් නොසළකා තාක්ෂණවේදය සහ උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා නව වැඩපිළිවෙළක් ආරම්භ කිරීම
2. දැනට පවතින වෘත්තිය පුහුණු ආයතන විධිමත් ඇගයීමකට ලක් කර සුදුසු ආයතන සම්පූර්ණ භෞතික හා විෂයමාලා නවීකරණයක් කොට, "One TVET" සංකල්පය යටතේ එම ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම
3. රට පුරා විහිදුණු නව "තාක්ෂණික සහ කාර්මික විශ්වවිද්‍යාල විද්‍යායතන" පද්ධතියක් ආරම්භ කිරීම
4. ජර්මන් කාර්මික අධ්‍යාපන ආයතනය පුළුල් කිරීම
5. දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම
6. වෘත්තිය අධ්‍යාපනයේ පශ්චාත් උපාධි මට්ටම් දක්වා අධ්‍යාපනය ලැබීමට අවස්ථා සලසා දීම
7. වෘත්තිය අධ්‍යාපනය හා ව්‍යවසායකත්වය ඒකාබද්ධ කරමින් තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා දැනුම ඇතුළත් කොට වෘත්තිය අධ්‍යාපනයේ විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම
8. විදේශ රැකියා උත්පාදනය හා විවිධාංගිකරණය පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
9. තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් බිහි කිරීම
10. අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘතිම බුද්ධිමය, ජෛව තාක්ෂණය, රොබෝ තාක්ෂණය, ඔග්මන්ටඩ් රියලිටි, ක්ලවුඩ් කම්පියුටින්, නැනෝ තාක්ෂණය, සහ ත්‍රිමාණ මුද්‍රණය වැනි නවීන තාක්ෂණයන් භාවිතය උපරිම තලයට ගෙන ඒම තුළින් ලංකාව නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම
11. පර්යේෂකයන්ට ඔවුන්ගේ නවෝත්පාදන සොයා ගැනීම සහ පර්යේෂණ වල නිර්මාණ අයිතිය සහතික කරන පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම
12. ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම
13. පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම
14. නවෝත්පාදන සහිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය/ විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම
15. නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිපල ආයෝජකයින් හා අදාළ භාවිතා කරන්නන් වෙත යොමු වීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම
16. කාර්මික විද්‍යාල, තාක්ෂණික විශ්වවිද්‍යාල හා ඒ යටතේ වන ආයතනික ව්‍යුහයන් අධ්‍යයනය කොට පවත්නා භෞතික සම්පත් වැඩි දියුණු කිරීමට ප්‍රමුඛත්වය දෙමින්, අදාළ දිස්ත්‍රික්කයේ, නිෂ්පාදන අංශවලට අවශ්‍ය නිපුණතා වර්ධනය කරමින්, රැකියා අවස්ථාවන්ට අවශ්‍ය උපාධි මට්ටමේ උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම
17. 2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනතට අනුකූලව ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
18. සාර්ථක ව්‍යවසායකත්වයක් හා ආදායම් උත්පාදන මෙවලමක් ලෙස වෘත්තීය තාක්ෂණ අධ්‍යාපනයේ විභවතාවය ප්‍රචලිත කරමින්, එය ජනතාවට සමීප කිරීමටත්, දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථා විවෘත කිරීමත් පිණිස ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා හඳුන්වා දීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
|---|---|
| 1. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන<br>2. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය<br>3. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)<br>4. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය<br>5. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීම් අධිකාරිය<br>6. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය<br>7. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව<br>8. ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>9. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම<br>10. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය<br>11. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව<br>12. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාලය<br>13. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව<br>14. ජාතික විද්‍යා පදනම<br>15. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය<br>16. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය<br>17. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය<br>18. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>19. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල<br>20. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | • වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)<br>• ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)<br>• ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)<br>• ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)<br>• ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනත (2019 අංක 22)<br>• විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>• ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත (2016 අංක 11)<br>• ශ්‍රී ලංකා නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත (1979 අංක 53)<br>• ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59)<br>• රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත (1957අංක 49)<br>• තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)<br>• ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55)<br>• ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත (2017 අංක 15) |

## 9.2 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අදාළව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
2. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබා දීම

3. නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයින්ට, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
4. නිරෝගී දරුවකු බිහි කිරීම මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මග පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම, කුසලතා හා කාලය ලබා දීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම
5. සියළු දරුවන් ගේ මන්දපෝෂණය නිම කිරීම සඳහා විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. අදාළ සියළු ආයතන ඒකාබද්ධව ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට පියවර ගැනීම
7. සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනමම අංශයක් දරුවන් සම්බන්ධව පමා වෙමින් ඇති සියළු නඩු විසඳීම සඳහා වෙන් කිරීම
8. ළමා මධ්‍යස්ථානවල සිටින දරුවන් සඳහා කැපකාර පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම
9. “ළමා මිතුරු පාසැල” සංකල්පය පුළුල් කිරීම
10. රාජ්‍ය නියාමනය යටතේ ජාතික පෙර පාසැල් ප්‍රතිපත්තිය මත පිහිටා පෙර පාසැල් අධ්‍යාපනය පුළුල් කිරීම
11. ග්‍රාමීය පාසල් සිසු ආකර්ශිත පාසල් බව පත්කිරීම
12. සියළුම පාසල්වල පන්ති කාමර හා සනීපාරක්ෂක උපකරණ, ගුරු ශිෂ්‍ය විවේකාගාර, සෞඛ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
13. පාසල් පෙළපොත්, විෂයය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ එළිදැක්වීමට පියවර ගැනීම
14. පොකුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම
15. තරුණ භික්ෂූන් වහන්සේගේ ඉංග්‍රීසි භාෂා දැනුම, පරිගණක සහ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා නව අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
16. පිරිවෙන් අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීම
17. භික්ෂූන්වහන්සේලා ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැපයීම
18. ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාපන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මාසික අනුග්‍රාහක දායකත්ව ක්‍රමයක් හඳුන්වා දීම
19. පරිවේණාධිපති ස්වාමීන්වහන්සේලා ගේ හා පිරිවෙන් ගුරුවරුන් ගේ නොවිසඳී ඇති පත්වීම්, වැටුප් සහ දීමනා පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>2. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>3. ළමා ලේකම් කාර්යාලය<br>4. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>5. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>6. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය | • ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)<br>• ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)<br>• පිරිවෙන් අධ්‍යාපන පනත (1979 අංක 64) |

**9.3** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත “දැනුමෙන් පිරිපුන් සමාජයක්” බිහි කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව උසස් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම
2. විශ්වවිද්‍යාල තුළ සහ නේවාසිකාගාරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම

3. දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම
4. විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීම
5. මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගැනීම හා එහි පහසුකම් පුළුල් කිරීම
6. සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම
7. සියළුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම
8. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම
9. නවක වද සංස්කෘතිය සියළු විශ්ව විද්‍යාල වලින් හා උසස් අධ්‍යාපන ආයතන වලින් තුරන් කිරීමට කටයුතු කිරීම
10. සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන<br>3. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය<br>4. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය<br>5. හාර්ඩි තාක්ෂණික ආයතනය | • විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)<br>• බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)<br>• ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74) |

**9.4 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත “දැනුමෙන් පිරිපුන් සමාජයක්” ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් විෂයානුබද්ධ ජනාධිපති කාර්ය සාධක බලකාය හා විශේෂ කමිටු වල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම
2. විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
3. තොරතුරු තාක්ෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ උපයෝජනය හා යටිතල පහසුකම් පුළුල් කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික අධ්‍යාපන ආයතනය | • ජාතික අධ්‍යාපන ආයතන පනත (1985 අංක 28)<br>• ආධාර ලබන පාසල් සහ අභ්‍යාස විද්‍යාල පනත (1960 අංක 5) |

**10.0 සෞඛ්‍ය අමාත්‍ය**

**01. විෂයපථය**

කායික, මානසික, සාමාජීය සුවතාව මෙන්ම, ආධ්‍යාත්මික සුවතාව ද ඉලක්ක කර ගනිමින් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මත පදනම්ව බටහිර මෙන්ම දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගීතාවය තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම සඳහා කටයුතු කිරීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “නිරෝගීමත් ජනතාවක්” බිහිකිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව සෞඛ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති, සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. කොවිඩ් -19 කාර්ය සාධන බලකාය මගින් කොවිඩ් - 19 වසංගත උවදුරට ලක්විය හැකි අවදානම් නිරන්තරයෙන් හඳුනාගෙන ඒවා වැලැක්වීමේ කටයුතු සිදු කිරීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. බෝවන රෝග මෙන්ම බෝනොවන රෝග වලක්වා ගනිමින් ජනතාවගේ ජීවිත අපේක්ෂාව ගුණාත්මක වශයෙන් ඉහළ නැංවීම හා ළදරු හා මාතෘ මරණ අවම රටක් ලෙස පවත්වා ගැනීම ඉලක්ක කරගත් සෞඛ්‍ය සේවාවක් ගොඩ නැගීම
2. පුද්ගලික වෛද්‍ය සේවාවන් හා පරීක්ෂනාගාර කටයුතු ජාතික ප්‍රතිපත්තියක් තුළ නියාමනය කිරීම සහ විධිමත් සේවාවක් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
3. තොරතුරු තාක්ෂණ ආයතන හා සම්බන්ධව තොරතුරු තාක්ෂණය භාවිතය මගින් හා කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් සැපයීම හරහා රෝගීන් සඳහා වන පොරොත්තු ලේඛණ, දිගු පෝලිම් හා තදබදය අවම කිරීමට පියවර ගැනීම
4. කොළඹ ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම
5. සෑම දිස්ත්‍රික්කයකම එක් රෝහලක් ජාතික රෝහල මට්ටමටම වැඩි දියුණු කිරීම හා දිස්ත්‍රික් තුළ ඇති අනෙකුත් ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල් පහසුකම් පුළුල් කිරීම
6. සියළුම රෝහල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සහ එම රෝහල් මඟින් අදාල රෝගීන් නියමිත රෝහල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම
7. වෛද්‍යවරුන් හා වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් මෙරට රඳවා ගැනීම සඳහා අවශ්‍ය වෘත්තීමය පහසුකම් වැඩිදියුණු කිරීම
8. සියළු දෙනාට ආරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා සියළුම රජයේ හා පෞද්ගලික සෞඛ්‍ය වෛද්‍ය ආයතනවල ISO තත්ත්ව සහතික මට්ටම ස්ථාපිත කිරීම
9. ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට යටත්ව රසායනාගාර පහසුකම් පුළුල් කිරීම
10. ප්‍රමිතියෙන් යුත් ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා වෙළඳපළ තුළ පාරිභෝගික සුරක්ෂිතතාව ආරක්ෂාවන මිල ගණන් ක්‍රියාත්මක වීමත්, ඖෂධ වෙළඳපළ ඒකාධිකාරය වැලැක්වීම සඳහාත්, ප්‍රමිතියෙන් යුත් ඖෂධ සැල් (Pharmacy) ප්‍රවර්ධනය සඳහා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම
11. ඖෂධ නිෂ්පාදනය සඳහා දේශීය ව්‍යාපාරිකයන් හා ආයෝජන දිරිගැන්වීමේ ක්‍රමෝපායන් සකස් කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික සෞඛ්‍ය සභාව<br>2. වෛද්‍ය පර්යේෂණ ආයතනය<br>3. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය | • සෞඛ්‍ය සේවා පනත (1952 අංක 12)<br>• වෛද්‍ය ආඥාපනත (1927 අංක 26)<br>• වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත (1912 අංක 9)<br>• මනෝ රෝග ආඥාපනත (1870 අංක 1) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 4. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව<br>5. ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව<br>6. පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව<br>7. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>8. සියලුම ජාතික, ශික්ෂණ හා නිශ්චිත රජයේ රෝහල්<br>9. වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල<br>10. ජාතික වෘක්කවේද, කාන්දු පෙරීම හා බද්ධ කිරීමේ ආයතනය<br>11. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව<br>12. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | • ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පනත (1981 අංක 13)<br>• සාත්තු නිවාස (නියාමනය) කිරීමේ පනත (1949 අංක 16)<br>• විෂ වර්ග, අබිං සහ අන්තරායක ඖෂධ වර්ග ආඥාපනත (1929 අංක 17)<br>• පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත (2006 අංක 21)<br>• ශ්‍රී ලංකා හෙද සභා පනත (1988 අංක 19)<br>• මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත (1987 අංක 48)<br>• ආහාර පනත (1980 අංක 26) |

**10.1 සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞඛ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීරෝගීමත් ජනතාවක්" බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රාථමික සෞඛ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. කොවිඩ්-19 සහ වෙනත් බෝවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සියළු පළාත් හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමග ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
2. වසංගත රෝග ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම සහ මාතෘ හා ළදරු මරණ අවම රටක් ලෙස පවත්වාගැනීමට මාතෘ හා ළදරු සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම
3. ග්‍රාමීය ජනතාවට පහසුවෙන් තම සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට හැකිවන පරිදි සියළුම ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල්වල වෛද්‍ය, හෙද හා ආශ්‍රිත අනෙකුත් සහායක පහසුකම් වැඩි දියුණු කිරීම
4. දරුවන් ගේ ප්‍රතිශක්තිකරණය වැඩි කිරීම සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ප්‍රාථමික සෞඛ්‍ය සේවා හා මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම
6. ජනතාව ගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. ග්‍රාමීය, පසුගාමී හා නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින්, වැඩිහිටි සෞඛ්‍ය අවශ්‍යතා පහසුකම් පුළුල් කිරීම
8. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, පවුල් සෞඛ්‍ය සේවා, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සතු ඩිස්පැන්සරි හා මාතෘ සායන සම්බන්ධීකරණය කරමින්, අඩු ආදායම්ලාභී සහ ග්‍රාමීය ජනතාව ගේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. 1990 සුවසැරිය පදනම<br>2. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම<br>3. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල<br>4. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල<br>5. අෂ්රොෆ් අනුස්මරණ රෝහල<br>6. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය<br>7. ජාතික ඖෂධ නියාමන අධිකාරිය | • 1990 සුවසැරිය පදනම පනත (2018 අංක 18)<br>• ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත (1983 අංක 54)<br>• විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනත (1999 අංක 38)<br>• දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත (2006 අංක 27)<br>• ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත (2015 අංක 5) |

**10.2 දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞඛ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීරෝගීමත් ජනතාවක්" බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව දේශීය වෛද්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ජාතික දේශීය වෛද්‍ය සභාවක් හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවක් ලියාපදිංචි කිරීම හා දේශීය වෙද මහතුන් දේශීය වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සැකසීම
2. ආයුර්වේද විද්‍යායතනයට පොදු විශ්ව විද්‍යාල පිලිගැනීමක් ඇති කිරීම
3. දේශීය ආයුර්වේද ඖෂධ සංග්‍රහය යාවත්කාලීන කිරීම
4. සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
5. දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගැන්වීම
6. ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා ඔසු පැළෑටි දේශීයව වගා කිරීම සඳහා දේශීය වෛදවරුන් සහ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපාරකයන්ගේ සහභාගිත්වයෙන් ඔසු පැළ වගා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම
7. වස විසෙන් තොර නිරෝගී ආහාර පරිභෝජනය සියළු වයස් කාණ්ඩ අතර ප්‍රචලිත කිරීම සඳහා සමෘද්ධි හා ගෘහ ආර්ථිකයන් ඉලක්ක කරගත් වැඩසටහන් පුළුල් කිරීම
8. බෝවන රෝග වැළැක්වීම හා බෝවන රෝග කලින් හඳුනා ගැනීම සඳහා දිවයින පුරා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව<br>3. ආයුර්වේද වෛද්‍ය සභාව<br>4. ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය<br>5. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්<br>6. හෝමියෝපති රෝහල වැලිසර<br>7. හෝමියෝපති වෛද්‍ය සභාව | • ආයුර්වේද පනත (1961අංක 31)<br>• හෝමියෝපති පනත (1970 අංක 7) |

**11.0 කම්කරු අමාත්‍ය**

**01. විෂයපථය**

කම්කරු නීති ප්‍රඥප්ති ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ සබඳතා පවත්වා ගනිමින්, කම්කරු ප්‍රජා ආරක්ෂණය, සුබසාධනය සිදු කිරීම හා කාර්මික සාමය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කම්කරු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති, සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. කම්කරු විෂයපථයට ගැනෙන සියළු චක්‍රලේඛ, නීති, අණපනත්, රීති, රෙගුලාසි සමාලෝචනය කොට වර්තමානයට ගැලපෙන සහ සේවක අයිතීන් සුරක්ෂිත කෙරෙන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම
2. සේවක අර්ථසාධක අරමුදලට අමතරව සේවකයින්ගේ සෑදෑසමය සුරක්ෂිත කරන දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම
3. කම්කරුවන්ගේ නිපුණතා හා කුසලතා දියුණු කරමින්, සේවා ස්ථානවල ඉහළ ප්‍රමිතීන් සහිත සනීපාරක්ෂක හා සේවක ආරක්ෂණ ක්‍රම පවත්වා ගනිමින් සේව්‍ය සේවක සුහදතාවය පදනම්ව ඵළදායී වැඩසටහන් දිරි ගැන්වීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. කම්කරු දෙපාර්තමේන්තුව<br>2. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය<br>3. සේවක අර්ථසාධක අරමුදල<br>4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය<br>5. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය<br>6. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | • සේවක මණ්ඩල පනත (1979 අංක 32)<br>• සේවක අර්ථසාධක අරමුදල පනත (1958 අංක 15)<br>• ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47)<br>• කර්මාන්ත ශාලා ආඥාපනත (1942 අංක 45)<br>• කාර්මික ආරවුල් පනත (1950 අංක 43)<br>• ප්‍රසූතිකාධාර ආඥාපනත (1939 අංක 32)<br>• ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත (2009 අංක 38)<br>• පාරිතෝෂික ගෙවීම් පනත (1983 අංක 12)<br>• සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත (1954 අංක 19)<br>• කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත (1971 අංක 45)<br>• වෘත්තීය සමිති ආඥාපනත (1935 අංක 14)<br>• පඩිපාලක සභා ආඥාපනත (1941 අංක 27)<br>• කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12) |

**11.1 විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. කම්කරු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එහි සේවා, විදේශ අමාත්‍යාංශය හා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති හා කොමසාරිස් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වන ඒකාබද්ධ පරිපාලන ක්‍රමවේදයක් සකස් කිරීම මගින් විදේශ රැකියාවල නිරතවන්නන්ගේ අවශ්‍යතාවන් කාර්යක්ෂමව ඉටු කිරීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. නුපුහුණු ශ්‍රම බලකායක් වෙනුවට විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමික වෙළෙඳපළ අවස්ථාවන් මෙන්ම විදේශ රැකියා වෙළෙඳපළ විවිධාංගීකරණයකට ප්‍රවේශවීම
2. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තමන් උපයන විදේශ විනිමය ඵලදායී ලෙස ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීම හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය දිරි ගැන්වීම
3. විදේශ රැකියා නිමකර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ ව්‍යාපෘති වැඩ පිළිවෙළවල් එම ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා සම්බන්ධ අමාත්‍යාංශ සමග ක්‍රියාත්මක කිරීම
4. මැදපෙරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
5. විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
6. පුද්ගලික විදේශ රැකියා නියෝජිතායතන නිසි ක්‍රමවේදයක් යටතේ නියාමනය කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>2. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම | • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත (1985 අංක 21)<br>• ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37) |

## 12.0 පරිසර අමාත්‍ය

**01. විෂයපථය**

තිරසාර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා ස්වභාවික සෞන්දර්ය රැක ගනිමින් ස්වභාවික සම්පත් පරිහරණය කිරීම මෙන්ම වන, වෘක්ෂලතා, වෙරළ, වගුරු බිම්, ඇළ, දොළ, ගංගා හා වන ජීවීන් ආරක්ෂා කිරීම, කැලිකසල වලක්වා ගැනීම හා ඉවත් කිරීම, පිරිසිදු නේවාසික පරිසරයක් හා තිරසාර ආර්ථික සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා ආයතනවලට අදාළ කටයුතු

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “තිරසර පරිසරයක්” ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. තිරසර පරිසර සංකල්පය, පාසල් අධ්‍යාපනයේ සිට ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම
2. පරිසර ආශ්‍රිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කොට පරිසර හිතකාමී මෙන්ම ජනතා හිතකාමී ලෙස එම ක්‍රියාවලිය මෙහෙයවීම සරල කිරීම
3. පරිසර හිතකාමී නිෂ්පාදන, බෙදාහැරීම්, ප්‍රවාහන සේවා, යටිතල පහසුකම්, නාගරික සංවර්ධන සහ ආයෝජන හා ආර්ථික කලාප කටයුතු මෙහෙයවීමේදී ව්‍යාපාරික හා සංවර්ධන අවශ්‍යතා තිරසර සංවර්ධන ඉලක්ක සමග තුලනය කිරීම
4. පරිසර සංරක්ෂණය සඳහා නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම
5. විදේශ ආයෝජන ප්‍රවර්ධන කටයුතු සම්බන්ධීකරණය

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. මධ්‍යම පරිසර අධිකාරිය<br>2. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>3. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම<br>4. ශ්‍රී ලංකා ක්ලයිමේට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | • පතල් හා ඛනිජ පනත (1992 අංක 33)<br>• ජාතික පාරිසරික පනත (1980 අංක 47) |

**13.0** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය

**01.** විෂයපථය

වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම හා පරසර සංවේදීවන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සම්පත් සංරක්ෂණය" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. වන ජීවීන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වනෝද්‍යාන, ජලාශ හා වන සතුන්ගේ ආහාර භෝග වගා පුළුල් කිරීම
2. වන සතුන්ගෙන් ග්‍රාමීය පළාත්වල නිවාස, දේපල හා වගාවන් සඳහා වන හානි අවම කර ගැනීමේ නවීන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
3. අලි - මිනිස් ගැටුම් වැලකෙන පරිදි එම අවදානම් ප්‍රදේශවල අලිවැට, අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවලවල් වලට සමගාමීව ප්‍රජා මූල ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම
4. වන වගාව පුළුල් කිරීම මගින් වන ඝනත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගෙවතු මට්ටමේ මෙන්ම පාසැල්, රෝහල්, කාර්යාල, වැඩපළවල් හා මාර්ග අවම ප්‍රදේශවල මෙන්ම නාගරික උද්‍යානවල වන වගාව හඳුන්වාදීම හා පුළුල් කිරීම
5. හරිත ආවරණය පුළුල් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය කරමින් ඒවා විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම
7. සෝදාපාලු හා නිසරු බිම් හඳුනාගෙන, පොල්, වෙනත් බෝග, තෘණ හා කෘෂි වන වගා උද්‍යාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම
8. කර්මාන්තශාලා ආශ්‍රිතව වන වගා තීරු, නාගරික රුක් ගොමු, අධිවේගී හා මහා මාර්ග ද ඇතුළත්ව මහදෙපස රුක් රෝපණය, රජයේ කාර්යාල ආශ්‍රිත ඉඩම්, මහල් නිවාස ආශ්‍රිත රුක් වගා, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීම
9. කැලෑ නැවත වගා කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
10. ගංගා ආශ්‍රිත හා භූමිය ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම් තීරු ස්ථාපනය කිරීම හා ගංගා නිම්න සංවර්ධනය
11. හරිත සහ සුහුරු නගර හා වාසස්ථාන සංකල්පය ඇති කිරීම හා ප්‍රචලිත කිරීමත්, පාරිසරික සංවේදී ජනතාවක් බිහිකිරීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
12. අලි මිනිස් ගැටුම් වැලැක්වෙන පරිදි ගම් හා ජනාවාස ආරක්ෂාව සඳහා අලිවැට, අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් ග්‍රාමීය ප්‍රජාදායකත්වයෙන් ක්‍රියාත්මක කිරීම
13. වනජීවීන්ගේ රැකවරණය සඳහා ඔවුන්ට වෙන් වූ භූමි ආරක්ෂා කිරීම, එම ප්‍රදේශවල වැව් ගංගා හා කැලෑ සංවර්ධනය කිරීම හා වන සතුන්ගේ ආහාර ප්‍රවර්ධනයට අවශ්‍ය වගාවන් ඇති කිරීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>3. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව<br>4. රාජ්‍ය දැව සංස්ථාව | • වනසංරක්ෂණ ආඥාපනත (1907 අංක 16)<br>• ජාතික උරුම වනභූමි පනත (1988 අංක 3)<br>• වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත (1937 අංක 2)<br>• ජාතික සත්වෝද්‍යාන පනත (1982 අංක 41) |

**14.0** කෘෂිකර්ම අමාත්‍ය

**01.** විෂයපථය

ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් මත පදනම්ව, නවීන තාක්ෂණ උපයෝගීතාවය තුළ සමෘද්ධිමත් දේශීය කෘෂි සංස්කෘතියක් හා කෘෂි ව්‍යාපාරික ප්‍රජාවක් බිහි කරමින් රටේ දළ ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබා දීම හා දේශීය හා ජාත්‍යන්තර පාරිභෝගිකයන් වෙත ප්‍රමාණවත් වස විසෙන් තොර ගුණාත්මක ආහාර හා කෘෂි නිෂ්පාදන සැපයීම, කෘෂිකාර්මික සම්පත් ඉහළ ඵලදායිතාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීම තුළින් ආහාර සුරක්ෂිතතාවය, ගොවි ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම, යැපුම් කෘෂිකාර්මික ක්‍රමවේදයන් වෙනුවට වාණිජමය වශයෙන් ඵලදායී නව තාක්ෂණික කෘෂි නිෂ්පාදනයකට පරිවර්තනයවීම හා කෘෂිකාර්මිකරණ ක්‍රියාවලියට (Agro industrialization) ප්‍රවේශ වීමෙන් සියලු පාර්ශ්වයන් ඇතුළත්වන ආර්ථික සංවර්ධනයක් ඇති කර ගැනීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති හා අණපනත්වලට අනුකූලව කෘෂිකර්ම විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළවල් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතයනයන්හි විෂයයන් හා කාර්යයන් සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම සඳහා එක් එක් ඉලක්ක කණ්ඩායම්වලට ගැලපෙන කෘෂි තාක්ෂණික දැනුම පුළුල් කිරීම
2. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම
3. කෘෂිකර්මාන්තය නගාසිටුවීම සඳහා අදාළ සියලු ආයතන ඒකාබද්ධ කෙරෙන යාන්ත්‍රණයක් සහිත ප්‍රවේශයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම
4. කෘෂිකර්මාන්තයේ දී යොදන රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
5. කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය පරිදි මූල්‍ය සම්පත්, වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම
6. සෘජු නිෂ්පාදකයින්, සැකසුම් ආයතන, තොග වෙළෙඳ සමාගම සහ අපනයන සමාගම් අතර සැපයුම් සබඳතා ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාදීම
7. නිෂ්පාදන අලෙවිකරණ පහසුකම් සඳහා නව උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
8. අස්වනු නෙලන අවස්ථාවන්හිදී රජයේ සැලසුම් සහගත මැදිහත්වීම මගින් නිෂ්පාදකයින්ගේ ආදායම පහළ වැටීම නියාමනය කිරීම
9. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම
10. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම
11. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>3. ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br>4. වී අලෙවි මණ්ඩලය<br>5. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය<br>6. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව<br>7. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | • කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)<br>• වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)<br>• ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)<br>• කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47) |

14.1 කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත “නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්” ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**0.2** සුවිශේෂී ප්‍රමුඛතා

1. වී හා ධාන්‍ය වර්ග ගම්මිරිස්, කරබු නැටි, කොකෝවා ඇතුළු ප්‍රධාන භෝග මෙන්ම එළවළු, පළතුරු හා ගෙවතු වගා සඳහා තාක්ෂණික වගා ක්‍රමයන් හඳුන්වා දීම, උසස් බීජ හා පැළෑටි මෙන්ම නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම
2. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව පරිසර හිතකාමී කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ උසස් මට්ටමේ පොහොර වර්ග ද රට තුළම නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම
3. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙලක් අදාළ ආයතන සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම
4. කාබනික පොහොර භාවිතය හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමෙන් පුළුල් කිරීම සඳහා සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ගෙවතු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
6. වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි, එළුණු සහ අල වැනි භෝග නිෂ්පාදනය වැඩි කිරීම මගින් එම නිෂ්පාදන ආනයන අවම කිරීම
7. අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සහ අගය එකතු කිරීමෙන් අපනයනය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
8. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා කෘෂි අස්වනු එක්රැස් කිරීමේ සහ සැකසීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම
9. එළවළු, පළතුරු ආශ්‍රිත අපනයන නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
10. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
11. ආනයන බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිළිගත් ප්‍රමිති සහතික තුළ එම ආනයනයන් සිදු කිරීම නියාමනය කිරීම
12. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම
13. ආවේණික ප්‍රවේණි ගුණයෙන් යුතු සහ ලෙඩ රෝගවලට හා දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන, අධි ඵලදා බීජ, පැළ වර්ග හඳුන්වා දීම
14. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය
15. නව තාක්ෂණික ක්‍රමවේදයන් තුළ භූ ජලය, බිම් සකස් කිරීම, බීජ හා පැළෑටි තෝරාගැනීම, පොහොර යෙදීම, පෙර හා පසු අස්වනු හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් පූර්ණ අධ්‍යයනයන් සිදු කොට ගොවීන් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම

16. තාක්ෂණික කෘෂිකර්මාන්තයක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික උපකරණ, ඉඩම් භාවිතය, මූල්‍ය දායකත්වය මගින් වෙළඳපළ වටිනාකම් එකතු කළ කාර්මික නිෂ්පාදන සඳහා යොමු කිරීම
17. අස්වනු නෙළීමේදීත්, ප්‍රවාහනයේදීත්, ගොඩබෑමේදීත් සිදුවන අපතේ යාම වළක්වා ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ කර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
18. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම මගින් වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් ජල පරිභෝජනයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික පොහොර ලේකම් කාර්යාලය<br>2. සීමාසහිත ලංකා පොහොර සමාගම<br>3. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම<br>4. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)<br>5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>6. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | • පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>• පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)<br>• පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)<br>• ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)<br>• ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)<br>• ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)<br>• බීජ වී පනත (2003 අංක 22)<br>• පස් සංරක්ෂණ පනත (1996 අංක 24) |

## 14.2 පශු සම්පත් රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පශු සම්පත් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැලපෙන පරිදි පශු සම්පත් හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම හා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම
2. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම
3. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම
4. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම
5. රජයේ සත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිතා කිරීමේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
6. කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම
7. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම
8. සත්ව ගොවිපලවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම
9. පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැලසීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්<br>3. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්<br>4. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම | • සත්ත්ව රෝග පනත (1992 අංක 59)<br>• සත්ත්ව ආහාර පනත (1986 අංක 15)<br>• සත්ත්ව පනත (1958 අංක 29)<br>• පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46) |

14.3 ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. සුවිශේෂිත භූගෝලීය ලක්ෂණයන් සහිත ප්‍රදේශයන්හි වගා කළ හැකි කහ, උඳු, ඉඟුරු, දේශීය අල වර්ග වැනි සුළු භෝග ගෘහ ආශ්‍රිත ඉඩම්වල වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. මූල්‍ය ආයතන, තාක්ෂණික සේවා ආයතන, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් හඳුනා ගෙන එමගින් සුළු භෝග ආශ්‍රිත ගෘහ නිෂ්පාදන පුළුල් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම සම්බන්ධීකරණය
3. අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගාමී ගම්වල ජීවනෝපාය මාර්ග හා මූලික අවශ්‍යතා සවිබල ගැන්වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ඇතුළත් පුනර්ජීවන මූල්‍ය සැපයුම් ක්‍රමවේදයක් හඳුන්වා දීම
4. ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ලක් වූ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග, වාරිමාර්ග, පානීය ජල පහසුකම්, විදුලිය, බෙහෙත් ශාලා හා ප්‍රාථමික පාසැල් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහන්වලට ප්‍රමුඛත්වය ලබා දීම සඳහා දිළිඳු බව පිටු දැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා ක්‍රියාත්මක වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය | • රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක 11) |

15.0 වාරිමාර්ග අමාත්‍ය

**01.** විෂයපථය

දිවයින පුරා ඇති වැව් හා වාරිමාර්ග, ජලාශ පද්ධතිය හා ආශ්‍රිත ඇළ වේලි සංරක්ෂණය කරමින් කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම ජල විදුලි බලාගාර හා පානීය ජලසම්පාදනයට අවශ්‍ය කළමනාකරණය, වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීම. ජලය කාර්යක්ෂමව පාවිච්චි කිරීමේ නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම සහ හා අදාළ කටයුතු

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ප්‍රශස්ථ වාරි කළමනාකරණයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව වාරිමාර්ග විෂයයට

අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදන කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලාපවහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය, මනා කළමනාකරණයක් යටතේ සපයා දීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. උමා ඔය, බහුවිධ වාරිමාර්ග යෝජනා ක්‍රමය හා ජල විදුලි බලාගාර කඩිනමින් නිම කිරීම.
2. මොරගහ කන්ද, කළුගඟ ආශ්‍රිත වාරිමාර්ග පද්ධතිය පුළුල් කරමින් උතුරු මැද හා වයඹ පළාත්වල වාරිමාර්ග හා ජලසම්පාදනය පුළුල් කිරීම
3. ගිං, නිල්වලා සහ මල්වතු ඔය ඇතුළු ප්‍රධාන ජල යෝජනා ක්‍රම කඩිනම් වැඩසටහනක් තුළ ක්‍රියාත්මක කිරීම
4. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම

**04. අදාළ ආයතනික හා හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>2. උමා ඔය, මොරගහකන්ද, කළුගඟ, ගිං, නිල්වලා, මල්වතු ඔය ඇතුළු අනෙකුත් ප්‍රධාන වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති<br>3. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>4. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව | • ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත (2017අංක 4)<br>• වාරිමාර්ග ආඥා පනත (1946 අංක 22)<br>• ගංවතුර ආරක්ෂණ ආඥා පනත (1924 අංක 24)<br>• රාජ්‍ය කාර්මික සංස්ථා පනත (1957 අංක 49 ) |

## 15.1 වාරිමාර්ග රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ත වාරි කළමනාකරණයක්" තුළ සියළු ජල මූලාශ්‍ර පවිත්‍ර කොට සියළු දෙනාට පානීය හා වාරි ජලය සැපයීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. කුඹුරු ඉඩම් පෝශ්‍ය ලෙස පිළිසකර කිරීම හා කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය කුඩා වැව් ප්‍රජා පාදක වැඩසටහන් මගින් ප්‍රතිසංස්කරණය කිරීම
2. වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය හා අනෙකුත් වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම
3. ගංගා ද්‍රෝණි, ඇල ඉවුරු, වැව් තාවුළු පිරිසිදු කොට වැව් ජලය සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීම
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජල සම්පත් මණ්ඩලය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරමින් අදාළ අංශ සමග ඒකාබද්ධ ක්‍රමවේදයක් යටතේ කටයුතු කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා |
|---|
| 1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුබද්ධ ආයතන |

## 15.2 මහවැලි රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ථ වාරි කළමනාකරණයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව මහවැලි විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. මහවැලි ගොවි කලාපවල වී, ධාන්‍ය. පළතුරු, එළවළු වගාවන්, මිරිදිය මත්ස්‍ය කටයුතු හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු
2. මහවැලි කලාප ජනාවාසවල අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, වෙළඳපොළ හා ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
3. මහවැලි කලාපවල උපරිම කෘෂි නිෂ්පාදන කටයුතු සඳහා ඉඩම් උපයෝගීකරණය හා ආයෝජන පුළුල් කිරීම

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | • ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරිය පනත (1979 අංක 23) |

## 16.0 ඉඩම් අමාත්‍ය

### 01. විෂයපථය

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් හරහා ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයක් තුළින් සංවර්ධන කාර්යයන්, නේවාසික කටයුතු හා පොදු අවශ්‍යතා සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යටතේ ඉඩම් ලබා දිම හා අනාගත පරපුර සඳහා භූමියේ අයිතිය සුරක්ෂිත කිරීම

### 02. කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ප්‍රශස්ථ ලෙස ඉඩම් කළමනාකරණය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ඉඩම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම

### 03. සුවිශේෂී ප්‍රමුඛතා

1. වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටලුවට පිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම
2. මහවැලි, උමා ඔය, මොරගහකන්ද වැනි විශාල වාරිමාර්ග ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්, නිවාස හා අනෙකුත් දේපල, ඉඩම් සහ කෘෂිකාර්මික ඉඩම් සඳහා නිසි තක්සේරුවක් සිදු කොට කඩිනමින් වන්දි ලබා දීමට අදාළ ආයතන සමග අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම
3. රජයේ ඉඩම් සහ පොදු ව්‍යාපෘති වශයෙන් අත්පත් කර ගන්නා ඉඩම් කෘෂි වගාවන් සඳහා බදු පදනම යටතේ ලබා දීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම
4. වතු සමාගම්වලට හා රජයේ ගොවිපොලවලට වෙන්කර දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දේශීය සහ විදේශීය ඉල්ලුමක් ඇති මල් වර්ග, කාබනික වගාවන් ඇති කිරීම සහ දේශගුණයට ගැළපෙන අතිරේක භෝග වගාවන් ව්‍යාප්ත කිරීම
5. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක, ස්වාභාවික සම්පත්, නාගරීකරණය සහ අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉඩම් පරිහරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම
6. යාවත්කාලීන ඉඩම් තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා පවත්වාගෙන යාම

7. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් කඩිනමින් ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණික ප්‍රවේශයක් සහිත කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම
8. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හා ඉඩම් ලබා දීමේ ක්‍රියාවලි සමාලෝචනයට ලක් කොට ඉඩම් අහිමි අඩු ආදායම්ලාභීන් සඳහා ඵලදායී නිෂ්පාදන කටයුතු සඳහා සංවර්ධන හා ආයෝජන ව්‍යාපෘති සඳහා මෙන්ම ඉඩම් කඩිනමින් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම
9. බිම් සවිය ඉඩම් අයිතිය තහවුරු කිරීමේ වැඩපිළිවෙළ කඩිනම් කිරීම, ඉඩම් විකිණීමෙන් ඉඩම් අහිමි ප්‍රජාවක් බිහිවීම වලක්වාලීම සහ ඉඩම් අයිතිය මත බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ලබා ගැනීමේ ප්‍රතිපත්තීන් හා නීතිමය රාමුවක් ගොඩ නැගීම
10. අවශේෂ ඉඩම් පරිහරණය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
11. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම
12. මහජනතාව වෙත ලබා දී ඇති රජයේ ඉඩම් ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම
13. බිම් සවිය වැඩපිළිවෙළ යටතේ රජයේ ඉඩම්ලාභී පුද්ගලයින්ගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා නිවැරදි මිණුම් සහිත දීමනා පත්‍ර නිකුත් කිරීමේ කඩිනම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
14. තරුණ ව්‍යවසායකත්වය දිරි ගැන්වීමේ ව්‍යාපෘතියක් ලෙස රජයේ ඉඩම්වල ආයෝජන අවස්ථා ලබා දෙමින් ඉඩම් කැබලි ලක්ෂයක් බැංකු සහ අදාළ අනිකුත් ආයතන සම්බන්ධීකරණය කරමින් තරුණයන් වෙත ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
15. භාවිතයට ගත හැකි, එහෙත් භාවිතයට නොගන්නා සහ ඌණ භාවිත ඉඩම්වල ගැටලු හඳුනාගෙන එම ඉඩම් උපරිම ඵලදායීතාවක් සහිතව භාවිතයට ගැනීම සඳහා නීතිමය ක්‍රමවේදයක් සකස් කිරීම
16. සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අත්පත් කරගෙන ඇති මෙතෙක් භාවිතයට නොගත් පෞද්ගලික ඉඩම් සංවර්ධන අවශ්‍යතාවයන් නිසි තක්සේරුවකට ලක් කිරීමෙන් පසුව එම ඉඩම් ඵලදායී ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
17. ස්වභාවික ව්‍යසන හෝ රජයේ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන් ඉඩම් අහිමිවූවන් වෙත දැනට පවතින විකල්ප ඉඩම් හා වන්දි ලබා දීමේ කටයුතු කඩිනම් කිරීම
18. රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව<br>3. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව<br>4. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය<br>5. ඉඩම් මැනුම් සභාව<br>6. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව<br>7. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | • ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1)<br>• ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9)<br>• ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19)<br>• ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත (1942 අංක 61)<br>• රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (1979 අංක 43)<br>• රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8)<br>• රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත (1979 අංක 7)<br>• මැනුම් පනත (2002 අංක 17)<br>• හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21 )<br>• ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20) |

**17.0** ධීවර අමාත්‍ය

**01.** විෂයපථය

දේශීය වශයෙන් මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතා සපුරාලමින්, දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් ශක්තිමත් ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකරලමින් ධීවර ප්‍රජාවගේ සමාජ හා ජීවන මට්ටම් ඉහළ නංවමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් දක්වන ධීවර කර්මාන්තයක් ඇති කිරීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා

ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ධීවර විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

03. **සුවිශේෂී ප්‍රමුඛතා**

1. වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම
2. ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත නව ධීවර වරායන් ඉදිකිරීම
3. අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම් වලට අවස්ථාව ලබාදීම
4. ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරි ගැන්වීම
5. නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදන සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම
6. උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණ කිරීම
7. ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම
8. සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
9. ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br>2. නෝර්ත් සී ලිමිටඩ්<br>3. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය | • ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)<br>• ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23)<br>• ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54) |

## 17.1 ධීවර රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් සහ කර්තව්‍යයන්

ධීවර අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ධීවර විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. අපනයන වෙළඳපොල ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
2. වැව්, කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම
3. මහා පරිමාණ බෝට්ටු වල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම
4. බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම
5. නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම
6. මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ආරම්භ කිරීම
7. පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම
8. ධීවරයින්ගේ සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>2. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව<br>3. සීමාසහිත සීනෝර් පදනම<br>4. ලංකා ධීවර සංස්ථාව | • ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53) |

## 18.0 වැවිලි කර්මාන්ත අමාත්‍ය

**01.** විෂයපථය

පර්යේෂණාත්මක විධි ක්‍රමයන් නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණයක් තුළින් අපනයන වෙළඳපළ ආකර්ශනය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් " ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වැවිලි කර්මාන්ත විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. තේ, රබර් සහ පොල් වගා කර ඇති ඉඩම් කැබලි කර ජනාවාස බවට පත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම හා එම ඉඩම් උපරිම ලෙස වැවිලි හා අතුරු වගා සංවර්ධනය සඳහා යොදා ගැනීම
2. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් උපරිම ලෙස වගා විවධාංගිකරණයට ලක් කිරීම හා ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම
3. නව තාක්ෂණය හඳුන්වා දෙමින් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය දායකත්වයක් සැපයිය හැකි ආකාරයට තේ පර්යේෂණ ආයතනය ප්‍රතිසංවිධානය කිරීම
4. මහා පරිමාණ තේ තොග අපනයනය වෙනුවට වටිනාකම් එකතුකළ ආකාරයෙන් තේ අපනයනය දිරිමත් කිරීම
5. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් Ceylon Tea සඳහා තේ වෙළඳපොල පුළුල් කිරීම
6. දේශීය පිරිසිදු තේ ශ්‍රී ලංකාවේ අනර්ඝතම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම
7. සමාගම් වතු උපරිම ඵලදායිතාවයකින්, තේ හා වෙනත් අපනයන භෝග වගා ප්‍රවර්ධන හා ඉහල වටිනාකම් ඇති අපනයන නිෂ්පාදන බවට පත් කිරීම සහ අවශ්‍ය ජාත්‍යන්තර වෙළඳපළ සකස් කිරීම
8. කාබනික තේ වගාව දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම
9. දේශීය තේවල ගුණාත්මක භාවය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම
10. වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම
11. තේ හා රබර් වතු ආශ්‍රිත වෙනත් භෝග වගාවන් හඳුන්වා දීම
12. නවීන තාක්ෂණික ක්‍රමවේදයන් හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් තේ හා රබර් කර්මාන්ත ශාලා පූර්ණ නවීකරණයකට ලක් කිරීම හා අවශ්‍ය මූල්‍ය පහසුකම් සඳහා බැංකු ක්‍රමය සම්බන්ධ කිරීම
13. ග්‍රාමීය මට්ටමේ තේ වගාව හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම සඳහා සහන සේවා ක්‍රමවේදයන් බිම් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම
14. කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ වගාවන් දියුණු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දීම මගින් රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම සුලභ කිරීම
15. දේශීය හා විදේශීය වෙළඳපොල ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය<br>2. ශ්‍රී ලංකා තේ මණ්ඩලය | • තේ, රබර් සහ පොල්වතු (කැබලි කිරීම පාලන) පනත (1958 අංක 2)<br>• ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය (1975 අංක 14) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 3. තේ පර්යේෂණ ආයතනය<br>4. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව<br>5. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය<br>6. සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව<br>7. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>8. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම<br>9. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව<br>10. රබර් පර්යේෂණ ආයතනය<br>11. සීමාසහිත රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව | • තේ පාලන පනත (1957 අංක 51)<br>• තේ සහනාධාර පනත (1958 අංක 12)<br>• තේ (බදු හා අපනයන පාලනය) පනත (1959 අංක 16)<br>• තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත (1979 අංක 45)<br>• කුඩා තේ වතු සංවර්ධන පනත (1975 අංක 35)<br>• රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත (1953 අංක 36) රබර් පර්යේෂණ මණ්ඩල ආඥාපනත (1930 අංක 10)<br>• රබර් පාලන පනත (1956 අංක 11) |

## 18.1 වැවිලි රාජ්‍ය අමාත්‍ය

### 01.කාර්යයන් හා කර්තව්‍යයන්

වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත ''නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්''ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වැවිලි විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. පොල් පර්යේෂණ ආයතනය හා පෞද්ගලික පර්යේෂණාගාර ඒකාබද්ධව අධි ඵලදා පොල් පැල හඳුන්වා දීම සහ දැනට පොල් වගා නොකරන පළාත්වලට ගැලපෙන පොල් පැල ප්‍රභේද හඳුන්වා දීම
2. ගෙවතු පොල් වගා ව්‍යාප්ත කිරීම සඳහා අධි ඵලදා පොල් වර්ග එක් එක් ප්‍රදේශවල භූගෝලීය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
3. විවිධ පළිබෝධකයන් පාලනය කිරීම සඳහා ජෛව තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම
4. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා තවාන් සංවර්ධනය කිරීමට කුඩා හා මධ්‍යම පොල් වගාකරුවන් දිරිමත් කිරීම
5. පොල්වතුවල ගම්මිරිස්, ඉඟුරු, කහ, කෝමාරිකා, අන්නාසි වැනි අතුරු භෝග වගාව මෙන්ම සත්ව ගොවිපොළ සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම
6. දේශීය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසීම
7. පොල් ඵල ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම
8. අගය එකතු කිරීම සහ තාක්‍ෂණික නවෝත්පාදනයන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට පර්යේෂකයන්, විද්‍යාඥයින් සහ නිෂ්පාදකයින් දිරිමත් කිරීම

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම<br>2. සීමාසහිත හලාවත වැවිලි සමාගම<br>3. තල් සංවර්ධන මණ්ඩලය<br>4. පොල් වගා කිරීමේ මණ්ඩලය<br>5. පොල් සංවර්ධන අධිකාරිය<br>6. පොල් පර්යේෂණ ආයතනය | • පොල් සංවර්ධන පනත (1971 අංක 46)<br>• තුරු සවිය අරමුදල පනත (2000 අංක 23)<br>• කප්රුක අරමුදල පනත (2005 අංක 31)<br>• පොල් පර්යේෂණ ආඥා පනත (1928 අංක 29) |

## 18.2 සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගාකරුවන් සඳහා බැංකු, මූල්‍ය ආයතන කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් වගා දිරිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
2. පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම
3. මෙම භෝග ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම හා අපනයනය පුළුල් කිරීම
4. අක්කර පහකට අඩු වතු හිමියන්ගේ භාවිතය සඳහා කුරුඳු නිස්සාරණය හා සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයක් පුළුල් කිරීම හා නව තාක්ෂණ උපකරණ ලබාදීම
5. ත්‍රිපෝෂ හා සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය සහ බැංකු හා මූල්‍ය ආයතන එක්ව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම
6. වසා දමා ඇති සියලු ම සීනි කර්මාන්තශාලා නොපමාව ආරම්භ කිරීමට කටයුතු කිරීම සහ අවශ්‍යතාව පරිදි නව කර්මාන්ත ශාලා ඉදිකිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම
7. උක් වගාව සඳහා අවශ්‍ය ජලය කාර්යක්ෂම ව භාවිත කිරීමට අවශ්‍ය වන තාක්ෂණික දැනුම හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමටත් කටයුතු කිරීම
8. ගෘහාශ්‍රිත භාවිතය සහ අපනයනය සඳහා ගම්මිරිස් වගා කිරීම සඳහා එම භෝග වවන ප්‍රදේශවල අපනයන ගම්මාන පිහිටුවීම

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා කජු සංස්ථාව<br>2. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම<br>3. කන්තලේ සීනි සමාගම<br>4. උක් පර්යේෂණ ආයතනය<br>5. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම<br>6. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>7. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම<br>8. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය | • උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)<br>• අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46) |

## 19.0 ජල සම්පාදන අමාත්‍ය

### 01. විෂය පථය

දිවයිනේ සියලු නිවෙස් ආවරණය වන පරිදි ජල සම්පාදනය කිරීමත්, පවත්නා ජල සම්පාදන හා ජල ප්‍රවාහන පද්ධති ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගැනීම, නඩත්තු කිරීම හා ධාරිතාව පුළුල් කිරීමත්, මල අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමටත්, පෞද්ගලික හා රාජ්‍ය ආයෝජන දිරි ගන්වමින් ප්‍රමිතියෙන් යුත් පානීය ජල සම්පාදනය හා බෙදා හැරීම

### 02. කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්ති මත පිහිටා "සැමට ජලය" ලබා දීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ජල සම්පාදන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත

දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. සැමට ජලය ලබා දීම සඳහා නව ජල සම්පාදන හා ජල ප්‍රවාහන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම
2. කෘෂිකර්ම අමාත්‍යාංශය හා වාරිමාර්ග අමාත්‍යාංශය විෂයපථයන් යටතේ ඇති පිළිවෙළින් ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතින් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාවය හා ග්‍රාමීය හා නාගරික ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම
3. පානීය ජල නල පද්ධතියේ හා බෙදා හැරීමේදී සිදු කරන නාස්තිය හා ජලය අපතේ යෑම වලක්වා ගැනීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2. ජල සම්පත් මණ්ඩලය | • ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2)<br>• ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29) |

## 19.1 ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

ජල සම්පාදන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සැමට ජලය" ලබා දීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ජල සම්පාදන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම
2. ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම
3. ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කර ගැනීම ජලාශ, ජල පෝෂිත මාර්ග සංවර්ධනය හා ජල සංරක්ෂණ කටයුතු
4. ජාතික වාරිමාර්ග පද්ධතිය මගින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන ව්‍යාපෘති ආශ්‍රිතව ජලය බෙදාහැරීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා |
|---|
| 1. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |

## 20.0 විදුලිබල අමාත්‍ය

**01. විෂයපථය**

දිගුකාලීන විදුලි ජනන සැලැස්ම උපයෝගී කර ගනිමින්, සියලුම නාගරික හා ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සඳහා විදුලි බල අවශ්‍යතා සපුරාලීම හා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල වෙළඳපළ තරගකාරිත්වය තහවුරු වන විදුලි බලය සැපයීම හා බලශක්ති සුරක්ෂිතතාවය ස්ථාපිත කිරීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අඩු වියදම් විදුලි ජනන සම්මිශ්‍රණයක් හා කාර්යක්ෂම බෙදාහැරීමක් සහතික කිරීම" සඳහා

අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදුලිබල විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරුජාලයක් සංවර්ධනය කිරීම
2. ලක් විජය ගල් අඟුරු විදුලි ජනන ව්‍යාපෘති ධාරිතාව සඳහා ආයෝජන පුළුල් කිරීම
3. පුනර්ජනනීය බලශක්ති, තාප බලාගාර, ස්වභාවික බලාගාර සම්මිශ්‍රණ තුලනය කරමින් විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම හා ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම
4. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම
5. විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම
6. කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ ජාත්‍යන්තර තරගකාරිත්වය පවත්නා පරිදි විදුලිබල පිරිවැය අවම කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්<br>2. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම<br>3. ලංකා විදුලිබල සමාගම<br>4. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම | • ලංකා විදුලිබල මණ්ඩල පනත (1969 අංක 17)<br>• ශ්‍රී ලංකා විදුලිබල පනත (2009 අංක 20) |

## 20.1 පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "අඩු වියදම් බලශක්තිය ලබාගැනීම සහතික කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. කැලණිතිස්ස බලාගාරය ස්වභාවික වායු ටර්බයින ආශ්‍රිත බලාගාරයක් බවට පත් කිරීම සහ කෙරවලපිටිය බලාගාරය පුළුල් කිරීම
2. ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම
3. නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදම් විදුලි බල ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති භාවිතය දිරිමත් කිරීම
4. කොළඹ ප්‍රදේශයේ ඇති සියලුම ඉන්ධන බලාගාර ස්වාභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම
5. ගෘහ කුටුම්භ හා කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම සඳහා වහල මත සවි කරන ලද සූර්යකෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම
6. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම
7. 2023 වන විට මොරගොල්ල ජල විදුලි බලාගාරය හා 2024 වන විට තලපිටිගල සහ සීතාවක ජල විදුලි බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම
8. මන්නාරම, පූනරීන් සහ මොණරාගල ප්‍රදේශවල සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙගාවොට් 800 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව<br>2. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය<br>3. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | • ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)<br>• ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35) |

## 21.0 බලශක්ති අමාත්‍ය

### 01.විෂයපථය

බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම හා ඉන්ධන ආනයනය අඩු කර ගැනීම සඳහා ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි ඛණිජ තෙල් හා ගෑස් ඇතුළු අතුරු නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම, ගබඩා පහසුකම් පුළුල් කිරීම හා බෙදාහැරීම් කටයුතු හා අදාල ප්‍රමිතීන්වල නියාමන කටයුතු හා අදාල රාජ්‍ය ව්‍යාපාර කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීම.

### 02. කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම" සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව බලශක්ති විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 03. සුවිශේෂී ප්‍රමුඛතා

1. ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාවය සහ ස්වයංපෝෂිතභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික රාමුව සකස් කිරීම
2. ස්වාභාවික වායුව ගවේෂණය කිරීම කඩිනම් කිරීම
3. තෙල් පිරිපහදු ධාරිතාවය පුළුල් කරමින් නවීකරණය කිරීම
4. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගබඩා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම
5. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම
6. කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් කාර්යක්ෂම බලශක්ති උත්පාදනය දිරිමත් කිරීම
7. නව ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බලශක්ති භාවිතය උපරිම කිරීම

### 04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව<br>2. සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය<br>3. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය<br>4. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම | • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961අංක 28)<br>• ඛනිජ තෙල් සම්පත් සංවර්ධන පනත (2003 අංක 26) |

## 22.0 වරාය හා නාවික අමාත්‍ය

### 01.විෂයපථය

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගර ජාලයත්, වාණිජ සහ මුදල් කේන්ද්‍රස්ථානයක්, ජාත්‍යන්තර කාර්මික හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙසත් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වරාය හා නාවුක සැපයුම් පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීම

### 02.කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තරගකාරී ලෙස ආනයන අපනයන පහසුකම් සැපයීමට වරාය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වරාය හා නාවික විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 03.සුවිශේෂී ප්‍රමුඛතා

1. කොළඹ සහ හම්බන්තොට මුහුදු වරායන් වාණිජ හා මගී වරායන් ලෙස සංවර්ධනය කිරීම හා ආයෝජන පුළුල් කිරීම

2. හම්බන්තොට වරාය කාර්මික හා සේවා වරායක් ලෙස සංවර්ධනය කිරීම සහ නැව් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ නැව් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වැනි සේවාවන් සැපයීම සඳහා දේශීය ව්‍යාපාර සඳහා පහසුකම් ඇති කිරීම
3. පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් පෑලියගොඩ, වෙයන්ගොඩ සහ රත්මලාන යන ප්‍රදේශවල මාර්ග හා දුම්රිය සහ සම්බන්ධතාව පදනම් කරගත් බහාලුම් අංගන සංවර්ධනය කිරීම
4. ප්‍රතිනැව්ගත කිරීම හැසිරවීමේ ධාරිතාවය, ගුදම් පහසුකම්, බහාලුම් අංගන, සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන වැඩි දියුණු කිරීම
5. කලාපීය අවශ්‍යතාවයන් සහ ජාතික ආර්ථිකයේ අවශ්‍යතා අනුව ගාල්ල, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමලය වරායන් සංවර්ධනය කිරීම
6. ජාතික කර්මාන්තයක් වශයෙන් ධීවර, නාවික හා සංචාරක ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය බෝට්ටු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
7. විදේශ වෙළෙඳපළ අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් අපනයනය සඳහා නැව් හා බෝට්ටු නඩත්තු, අළුත්වැඩියා හා නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම හා දිරි ගැන්වීම
8. නැව් හා බෝට්ටු නිෂ්පාදන සඳහා අවශ්‍ය ඉංජිනේරු හා තාක්ෂණික පහසුකම්, එම නිෂ්පාදන සඳහා අවශ්‍ය තටාංගන හා යටිතල පහසුකම් සංවර්ධනය
9. ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව සමග සම්බන්ධීකරණය

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණපනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සීමාසහිත ලංකා නැව් සංස්ථාව<br>3. වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය | • ලංකා නැව් සංස්ථා පනත (1971 අංක 11)<br>• නැව් නියෝජිතයින්ට බලපත්‍රදීමේ පනත (1972 අංක 10)<br>• මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥාපනත (1865 අංක 6)<br>• වෙළෙඳ නැව් පනත (1971 අංක 52)<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත (1979 අංක 51)<br>• පහයන තටාක හා ජේටන්ටි දියත් ආඥාපනත (1908 අංක 5)<br>• බෝට්ටු ආඥාපනත (1900 අංක 4) |

## 23.0 මහාමාර්ග අමාත්‍ය

**01.** විෂයපථය

මහජනතාවට යාම් ඊම් සඳහා අවශ්‍ය මාර්ග පහසුකම් සැපයීම හා ශ්‍රී ලංකාව සංවර්ධිත ආර්ථිකයක් කරා රැගෙන යාමට අවශ්‍ය සහසම්බන්ධිත මාර්ග පද්ධතියක් ස්ථාපනය කිරීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "සහ සම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීම හා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව මහාමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය,ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. අදාළ ආර්ථික, ආයෝජන කලාප හා ග්‍රාමීය හා නාගරික මාර්ග සම්බන්ධ කරමින් සංවර්ධනය නොකළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
2. කොළඹ මහනුවර වරාය පිවිසුම් උස් අධිවේගී මාර්ගය, උතුරු අධිවේගී මාර්ගය, රුවන්පුර අධිවේගී මාර්ගය, නව කැලණි පාලම සිට අතුරුගිරිය අධිවේගී මාර්ගය සම්පූර්ණ කිරීම
3. කාර්යක්ෂම මාර්ග සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අවශ්‍ය යටිතල පහසුකම්, වාහන තදබදය අවම කිරීම සඳහා පද්ධතියක් නිර්මාණය කිරීම හා සෑම ප්‍රධාන නගරයක ම යාන්ත්‍රික සිරස් වාහන අංගන පිහිටුවීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණපනත් |
|---|---|
| 1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සහස්‍යා ඉන්වෙස්මන්ට් ලිමිටඩ් | • ජාතික මංමාවත් පනත (2008 අංක 40)<br>• මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73) |

## 23.1 මහාමාර්ග රාජ්‍ය අමාත්‍ය

**01.** කාර්යයන් හා කර්තව්‍යයන්

මහාමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව මහාමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් උදෙසා මහාමාර්ග පද්ධතිය භාවිතය සම්බන්ධයෙන් වන ක්‍රමෝපායික සැලැස්ම තුළ හඳුනාගත් ව්‍යාපෘති සම්බන්ධීකරණය
2. ප්‍රධාන මාර්ග සැලැස්ම හා බැඳුණු ආනුශංගික මාර්ග වැඩිදියුණු කිරීම

## 23.2 ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

මහාමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය මාර්ග සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02.** සුවිශේෂී ප්‍රමුඛතා

1. ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම
2. ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සකස් කිරීම
3. මාර්ග ජාලය හා බැඳුණු පාලම් පද්ධතිය නවීකරණය කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා |
|---|
| 1. මග නැගුම<br>2. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව |

## 24.0 ප්‍රවාහන අමාත්‍ය

**01.** විෂයපථය

මගී හා භාණ්ඩ ප්‍රවාහනය, සංචාරක මගී පහසුකම්, අදාල යටිතල පහසුකම්, සේවා ප්‍රමිතීන්, මාර්ග තදබද හා අනතුරු වලක්වා ගැනීමේ සමස්ථ ප්‍රවාහන සේවය පොදු කාලසටහනකට ක්‍රියාත්මක වන ජනතා විශ්වාසය තහවුරු වන ප්‍රවාහන සේවයක් පවත්වා ගැනීම, ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා මහා මාර්ග හා දුම්රිය මාර්ග පදනම් කරගත් පරිසර හිතකාමී මෙන්ම මහජන හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඒ්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම
2. පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම
3. මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළයුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වා දීම
4. රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ-ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම
5. දුම්රිය හා බස්රථ නැවතුම් පළවල ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාල යටිතල පහසුකම් සංවර්ධනය
6. දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම
7. බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම
8. කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම
9. තොරතුරු තාක්ෂණයේ යෙදීම මගින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත්කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණපනත් |
|---|---|
| 1. ජාතික ගමනාගමන කොමිෂන් සභාව<br>2. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව<br>3. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | • ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත (1991 අංක 37)<br>• දුම්රිය පනත (1950 අංක 18) |

## 24.1 ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

ප්‍රවාහන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඒ්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතාවන්**

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාබ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පොළවල්වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම
2. වත්මන් බස් සංචිතය ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස් රථ හඳුන්වා දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහයට අනුකූල කරගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම
3. දුම්රිය මැදිරි, බස් රථ, මෝටර් රථ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවාවක් ගොඩනැගීම

4. පාසල් බස් රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම
5. ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම
6. මගී හා ප්‍රවාහන සේවක ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම
7. රියදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත්කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණපනත් |
|---|---|
| 1.සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පෞද්) සමාගම<br>2.ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය<br>3.ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය<br>4.මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (2005 අංක 27)<br>• ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත (1997 අංක 25)<br>• මෝටර් රථ ප්‍රවාහන පනත (1951 අංක 14) |

## 25.0 තරුණ හා ක්‍රීඩා අමාත්‍ය

**01.** විෂයපථය

අභිමානවත්, තුලිත පෞරුෂත්වයකින් හෙබි, ජවසම්පන්න තරුණ ප්‍රජාවක් ඇතිකිරීම, බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කරමින් සෞඛ්‍ය සම්පන්න ළමා හා තරුණ පිරිසක් බිහිකිරීම, ක්‍රීඩා හිතකාමී ජන සමාජයක්, නාගරික සංවර්ධන, සංචාරක, වාණිජ හා ජාත්‍යන්තර සබඳතා ගොඩනගන ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම

**02.** කාර්යයන් හා කර්තව්‍යයන්

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “අභිමානවත් ජව සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීම” සඳහා අදාල රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03.** සුවිශේෂී ප්‍රමුඛතා

1. රටේ අධ්‍යාපන, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික පෙරදැක්මට තරුණ සහභාගීත්වයේ ක්‍රියාකාරී දායකත්වය ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම
2. ආර්ථික ක්ෂේත්‍ර තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරිම අවස්ථා සළසා දීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් හඳුන්වා දීම සඳහා ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
3. රාජ්‍ය, පෞද්ගලික සහ විදේශීය රැකියා අවස්ථාවන් සඳහා ගැළපෙන, ශ්‍රී ලාංකීක තරුණයන් නිවැරදිව හඳුනා ගැනීම පහසු කිරීම සඳහා “තරුණ මානව සම්පත් දත්ත බැංකුවක්” ආරම්භ කිරීම
4. ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවන් සඳහා කුසලතා සංවර්ධනය පුළුල් කිරීම
5. ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හා සංචාරක, නාගරික ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගන ක්‍රීඩා ආර්ථිකයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම
6. ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් තුළ විවිධ කුසලතාවයන් පිරි ක්‍රීඩා සහභාගීත්වයක් ඇති කර ජාත්‍යන්තර ක්‍රීඩක පරිසරයක් බිහිකිරීම
7. ක්‍රීඩා සමිති සංවිධාන හා ව්‍යාපාරික ප්‍රජාව ක්‍රීඩා තරගාවලි (events) සඳහා දිරි ගැන්වීම
8. සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීම සඳහා ශාරීරික ව්‍යායාම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ හා දිරි ගැන්වීම් ලබා දීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණපනත් |
|---|---|
| 1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>2. ජාතික තරුණ සේවා සභාව<br>3. ජාතික යොවුන් සේනාංකය | • ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)<br>• යොවුන් සේනාංක පනත (2002 අංක 21)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 4. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය<br>5. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය<br>6. ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනය<br>7. ජාතික ක්‍රීඩා සභාව | • ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා පනත (1973 අංක 25)<br>• ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත (2019 අංක 24) |

25.1 තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජවසම්පන්න පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමුවීම වළක්වමින් පාසල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහා ද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍ය වෙත හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම
2. අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසල් දරුවන් ආකර්ශණය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
3. දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිටම හඳුනාගෙන ඔවුන්ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙනඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
4. ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞත චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයන් බිහිකිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
5. දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩා භූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක් කොට ඒවා ඊට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීම
6. දේශීය සම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවලක් සකස් කිරීම
7. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා අධ්‍යාපනය පුළුල් කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික ක්‍රීඩා විද්‍යායතනය<br>2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය<br>3. ක්‍රීඩා වෛද්‍ය ආයතනය<br>4. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය<br>5. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | • සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරී පනත (1999 අංක 17)<br>• ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33) |

26.0 සංචාරක අමාත්‍ය

**01. විෂයපථය**

ශ්‍රී ලාංකීය සංස්කෘතිය, ජෛව විවිධත්වය, පරිසර හිතකාමීත්වය හා මිත්‍රශීලී ජන අනන්‍යතාවය මත කරමින් ශ්‍රී ලංකාව සංචාරක ආකර්ශිත රටක් බවට පත්කරමින්, ඉහළ ආදායම් ලබන රැකියා හා ජීවනෝපාය ක්ෂේත්‍රයක් හා උසස් විදේශ විනිමයක් උපයන ආර්ථික ක්ෂේත්‍රයක් ලෙස සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ඉහළ විදේශ විනිමයක් අරමුණු කරගත් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක්"ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති

සහ අණපනත්වලට අනුකූලව සංචාරක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. පුළුල් පුද්ගල සහභාගිත්වයෙන් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීමට වැඩපිළිවෙලක් සැකසීම
2. සංචාරකයින් ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් සකස් කිරීම
3. විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම
4. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම
5. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම් සැපයීම
6. ප්‍රධාන සංචාරක නගර සම්බන්ධ කරන මාර්ග මංසන්ධිවල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම
7. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මඟින් සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
8. ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම
9. ගෘහ ආශ්‍රිත හා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම
10. සියලුම සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ අනන්‍යතාව සහතික කිරීමට කටයුතු කිරීම
11. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් හඳුන්වා දීම
12. තොරතුරු තාක්ෂණය මඟින් සංචාරකයින්ට පහසුකම් සැලසීම
13. One Stop සංකල්පය යටතේ එක් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හරහා සිදු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
14. උසස් තත්ත්වයේ සංචාරක හෝටල් පිහිටු වීමට සහ දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීම
15. ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිලිබඳ නිවැරදි තොරතුරු සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම සඳහා සංචාරක මගපෙන්වන්නන් හට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය<br>4. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය<br>5. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | • සංචාරක පනත (2005 අංක 38)<br>• උද්භිද උද්‍යාන ආඥාපනත (1928 අංක 31) |

## 26.1 සංචාරක රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

සංචාරක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ඉහල විදේශ විනිමයක් අරමුණු කරගත් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සංචාරක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. පවතින නිදහස් වෙළඳ කලාප හා කර්මාන්තපුර උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නැංවීම හා නවීකරණය නොපමාව සිදුකිරීම
2. කටුනායක ගුවන් තොටුපලේ දෙවන ධාවන පථය සහ මගී පර්යන්තය සංවර්ධනය කිරීම
3. කටුනායක ගුවන් තොටුපලේ අභ්‍යන්තර ගුවන් මගී පර්යන්තයක් සංවර්ධනය කිරීම

4. නුවරඑළිය ගුවන් තොටුපල ඇතුළු අභ්‍යාන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම
5. මත්තල ගුවන් තොටුපලේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම
6. ශ්‍රීලන්කන් ගුවන් සේවය ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතිකරණයක් දක්වා උසස් කිරීම සඳහා කටයුතු කිරීම
7. ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම
8. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සිවිල් ගුවන්සේවා අධිකාරිය<br>2. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම<br>3. සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම් | • ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත (2002 අංක 34)<br>• සිවිල් ගුවන් සේවා පනත (2010 අංක 14)<br>• ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත (1982 අංක 02)<br>• ගුවන් ප්‍රවාහන පනත (2018 අංක 29)<br>• ගගන යාත්‍රාංගන හා ගුවන් ප්‍රවාහන පනත (1950 අංක 15) |

## 27.0 වෙළඳ අමාත්‍ය

**01. විෂයපථය**

පාරිභෝගිකයින් ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "පාරිභෝගික ආරක්ෂණය සහ සක්‍රීය සමුපකාර ව්‍යාපාරයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වෙළඳ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතාවන්**

1. වෙළඳපළ අසමතුලිතතාවයන්ගෙන් මතුවන භාණ්ඩ හිඟයන් හා මිල අස්ථාවරවීම් වළක්වා ගැනීම
2. දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් කිරීම
3. ආනයන හා දේශීය නිෂ්පාදන මගින් වෙළඳපලේ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ සැපයීම පුළුල් කිරීම
4. සක්‍රීය සමුපකාර වෙළඳසැල් ජාලය පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය විවිධ භාණ්ඩ හා සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ආයතනගත කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සමුපකාර තොග වෙළඳ සංස්ථාව<br>2. සීමාසහිත ලංකා සතොස<br>3. මහපොළ භාරකාර අරමුදල<br>4. ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව<br>5. වාණිජ දෙපාර්තමේන්තුව<br>6. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන | • සමුපකාර තොග වෙළඳ සංස්ථා පනත (1949 අංක 44)<br>• වෙළඳුන්ට බලපත්‍ර දීමේ පනත (1961 අංක 62)<br>• මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66) |

## 27.1 වෙළඳ රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

වෙළඳ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "පාරිභෝගික ආරක්ෂණය සහ ශක්තිමත් සමුපකාර ව්‍යාපාරයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වෙළඳ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

ගුණාත්මක පාරිභෝගික භාණ්ඩ හිඟයකින් තොරව සහනදායී මිළ ගණන් යටතේ පාරිභෝගික ජනතාව වෙත කඩිනමින් ලබා දීම සඳහා නවීන තාක්ෂණය භාවිතය තුළ කඩිනම් ක්‍රමවේද සකස් කිරීම

### 03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය<br>2. මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව<br>3. අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br>4. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව<br>5. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | • ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)<br>• බුද්ධිමය දේපල පනත (2003 අංක 36)<br>• මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත (1995 අංක 35)<br>• කිරුම් හා මිනුම් ආඥාපනත (1946 අංක 37)<br>• අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32) |

## 27.2 සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය

### 01. කාර්යයන් හා කර්තව්‍යයන්

1. වෙළඳ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "පාරිභෝගික ආරක්ෂණය සහ ශක්තිමත් සමුපකාර ව්‍යාපාරයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. නව තාක්ෂණය මුසුවූ ශක්තිමත් හා කාර්යක්ෂම වෙළඳ ජාලයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

### 02. සුවිශේෂී ප්‍රමුඛතා

1. සමුපකාර සේවා මධ්‍යස්ථාන පද්ධතිය විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතියක් යටතේ ලාබ ලබන ආයතන ජාලයක් බවට පත්කිරීම
2. කෘෂිකර්මාන්තය, කිරි නිෂ්පාදන කර්මාන්තය, ධීවර කර්මාන්තය ප්‍රමුඛ දේශීය ගොවි නිෂ්පාදන සහ සුළු අපනයන භෝග වගාව වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව පුළුල්ව පැතිරුණු දියුණු සහ ශක්තිමත් නිෂ්පාදන සමුපකාර ක්‍රමයක් ආරම්භ කිරීම සහ සමුපකාර හා සතොස වෙළඳ ජාල ඔස්සේ ඍජු වෙළඳපලක් සකස් කර දීම
3. නිෂ්පාදන සමුපකාර ව්‍යාපාර මගින් තරුණ සහ කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා අපනයනය පදනම් කරගත් වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම
4. සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ හඳුන්වා දීමේ වගකීමත් නිෂ්පාදන සමුපකාර වලට පැවරීම
5. ප්‍රාග්ධනය සැපයීම සඳහා සියළු සමුපකාර සමිතිවල දායකත්ව ලබා සමුපකාර සංවර්ධන බැංකු ජාලය ශක්තිමත් කිරීම
6. සෞඛ්‍යයට අහිතකර පාරිභෝගික භාණ්ඩ වෙළඳපලට ඇතුල්වීම වැළැක්වීමට පියවර ගැනීම
7. පාරිභෝගික ද්‍රව්‍ය සඳහා සෞඛ්‍ය ආරක්ෂිත බව ද ඇතුළත්ව නියමිත ප්‍රමිතිකරණයක් ඇති කිරීම

**03.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>2. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය<br>3. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්)<br>4. සමුපකාර සේවක කොමිෂන් සභාව | • පාරිභෝගික කටයුතු අධිකාරී පනත (2003 අංක 9)<br>• ජාතික සමුපකාර සංවර්ධන ආයතන (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)<br>• සමුපකාර සේවක කොමිෂන් සභා පනත (1972 අංක 12)<br>• සමුපකාර සමිති පනත (1972 අංක 5) |

28.0 **කර්මාන්ත අමාත්‍ය**

**01.** **විෂයපථය**

කර්මාන්ත විවිධාංගීකරණයක් හරහා දේශීය, කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය තරඟකාරීත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය

**02.** **කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03.** **සුවිශේෂී ප්‍රමුඛතා**

1. සියලුම කර්මාන්තකරුවන් මුහුණදෙන ගැටලු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
2. ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම
3. අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියලු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
4. පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
5. බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
6. දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම
7. දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්ත පුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියලුම යටිතල පහසුකම් ලබාදීම
8. දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණ භාවිතකර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම

**04.** අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය<br>2. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්<br>3. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්<br>4. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව | • කර්මාන්ත සංවර්ධන පනත (1969 අංක 36)<br>• කර්මාන්ත ප්‍රවර්ධන පනත (1990 අංක 46)<br>• ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17) |

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 5. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)<br>6. මාන්තායි සෝල්ට් ලිමිටඩ්<br>7. අලිමංකඩ ලුණු ලේවාය<br>8. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය<br>9. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම<br>10. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව<br>11. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්<br>12. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්<br>13. ලංකා පිහන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)<br>14. සීමාසහිත බී.සී.සී.සමාගම<br>15. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>16. ලංකා ඛනිජ වැලි සමාගම | • ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41) |

28.1 කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු ඇතුලු ග්‍රාමීය කර්මාන්ත අගය වැඩිකිරීමේ කර්මාන්ත ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම
2. වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටලුවට පිළියමක් ලෙස වගා සමූපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම
3. දැව සහ ලී බඩු නිෂ්පාදකයන් මුහුණ දී සිටින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අර්බුදයට විසඳුමක් ලෙස තීරු බදු රහිතව පොතු සහිත දැව කඳන් ආනයනයට අවසර දීම
4. වාත්තු සහ ලෝකුරු කර්මාන්ත වැනි සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිතව ඇති අමුද්‍රව්‍ය සහ වෙළෙඳපොළ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා සහාය වීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය<br>2. විදාතා මධ්‍යස්ථාන<br>3. ජාතික ශිල්ප සභාව<br>4. අපේ ගම - කාර්යාල පරිශ්‍රය | • ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)<br>• ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4) |

28.2 **පේෂ කර්මාන්ත හා දේශීය ඇගලුම් නිෂ්පාදන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය**

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පේෂ කර්මාන්ත හා දේශීය ඇගලුම් නිෂ්පාදන ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික

සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳපල තුළ ඇඟලුම් නිෂ්පාදන හා සැපයුම පුළුල් කිරීම මගින් දේශීය ඇගළුම් සඳහා සංචාරක වෙළඳපළ සංවර්ධනය
2. බතික් කර්මාන්තය සඳහා අවශ්‍ය ඩයි වර්ග ඇතුළු ඉහළ ගුණත්වයෙන් යුතු අනිකුත් අමුද්‍රව්‍ය අවශ්‍යතා සැපයීම සඳහා වැඩපිළිවලක් සැකසීම
3. දේශීය හා විදේශීය වශයෙන් බතික් හා අත්යන්ත්‍ර කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
4. රෙදිපිළි අලෙවි පුරවරයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම
5. රෙදිපිළි නිෂ්පාදන වෙළඳපල විවෘත හා තරඟකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම
6. මහා පරිමාණ දේශීය ආයෝජකයන්ට අධිතාක්ෂණික නිෂ්පාදන අළුතින් ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය<br>2. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>3. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්<br>4. ලංකා සළුසල ලිමිටඩ්<br>5. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)<br>6. ජාතික මෝස්තර මධ්‍යස්ථානය | • ශ්‍රී ලංකා පේෂකර්මාන්ත හා ඇඟලුම් ආයතන පනත (2009 අංක 12)<br>• රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33) |

## 28.3 මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

**01. කාර්යයන් හා කර්තව්‍යයන්**

කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව මැණික්, ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**02. සුවිශේෂී ප්‍රමුඛතා**

1. පුද්ගලික අංශය සමග තරඟකාරී මට්ටමින් මැණික් ආශ්‍රිත කර්මාන්ත නිර්මාණශීලී ප්‍රවේශයක් හරහා නව්‍යකරණයට ලක් කිරීම
2. වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කරන මැණික් අපනයනය සීමා කොට ඒ ආශ්‍රිත කර්මාන්තයන් සඳහා වටිනාකම එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි අපනයන නිෂ්පාදන බවට පත්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
3. කපා ඔප දමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කිරීම
4. මැණික් හා ඛණිජ සම්පත් කර්මාන්ත ආශ්‍රිතව ලබා ගත යුතු පරිසර හා අනෙකුත් අවසර පත්‍ර ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කොට සරල කිරීම හා කර්මාන්තකරුවන් වෙත එම සේවා සැපයීම් පහසුකරලීම

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br>2. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | • ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50) |

## 29.0 ජනමාධ්‍ය අමාත්‍ය

### 01. විෂයපථය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීමය කුසලතා සංවර්ධනයට කටයුතු කිරීම

### 02. කාර්යයන් හා කර්තව්‍යයන්

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “විනිවිද භාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම” සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කිරීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### 03. සුවිශේෂී ප්‍රමුඛතා

1. විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
2. ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම
3. ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම
4. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම
5. මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමින් ජනමාධ්‍ය කටයුතු පුළුල් කිරීම
6. ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම
7. සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තීමය දැනුම හා අවබෝධය ලබා දීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වාදීම
8. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම
9. නව තාක්ෂණය පදනම්ව කාර්යක්ෂම හා නව අවස්ථාවන්ට ඉලක්කගත වූ ජනතා කේන්ද්‍රීය ඩිජිටල් තැපැල් හා ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම

### 04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව | • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12) |
| 2. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | • ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5) |
| 3. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | • ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37) |
| 4. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | • ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8) |
| 5. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | • ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත(1986 අංක 6) |
| 6. ස්වාධීන රූපවාහිනී ජාලය | • ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28) |
| 7. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | • ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5) |
| 8. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | • ශ්‍රී ලංකා පදනම් පනත ( 1973 අංක 31) |
| 9. සීමාසහිත ලංකා පුවත් ආයතනය | • මුද්දර ආඥාපනත (1909 අංක 22) |
| 10. සැලසිනේ රූපවාහිනී ආයතනය | • තැපැල් කාර්යාල ආඥාපනත (1908 අංක 11) |
| 11. ශ්‍රී ලංකා පදනම | • ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18) |
| 12. තැපැල් දෙපාර්තමේන්තුව | |
| 13. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | |

## 30.0 මහජන ආරක්ෂක අමාත්‍ය

### 01. විෂයපථය

සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම මගින් මහජන ආරක්ෂාව තහවුරු කිරීම හා නීතිය හා සාමය පවත්වා ගැනීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "මහජන ආරක්ෂාව තහවුරු කිරීම" සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව මහජන ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.
2. සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙළ ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසැල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.
3. අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
4. ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්ධනය කිරීම හා මැඩපැවැත්වීම.
5. රටේ සියලුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සැමවිටම පවත්වාගෙන යෑම.
6. රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරු සිදුවන මරණ, ආබාධ, රෝහල් ගතවීම් වලක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම් මංතීරු හා මාර්ග සඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම් හා මග දෙපස රථවාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලිසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවීකරණය කිරීම.
7. ජනතා හිතකාමී හා මහජන මිතුරු පොලිස් සේවාවක් ක්‍රියාත්මක කිරීම සුදුසු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
8. පොලිසිය හා මහජනතාව අතර සමීප සම්බන්ධතාවය ඇති කිරීම පිණිස ප්‍රාදේශීය, දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා සහභාගිත්වය සහිත උපාය මාර්ගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
9. ප්‍රජා පොලිස් ඒකක හා ප්‍රජා නායකයන් හා සම්බන්ධීකරණයෙන් ග්‍රාමීය ඒකක වශයෙන් ආරක්ෂාව තහවුරු කරගැනීම සඳහා සහ හදිසි ආපදාවලදී සහාය වීමට හැකි ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම
10. ප්‍රජා පාදක පොලිස් සේවාව පිළිබඳ අදාළ නිලධාරින්ට පුළුල් දැනුමක් ලබා දීමටත්, ආකල්ප සංවර්ධන සඳහාත් එම නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
11. පොලිස් බල ප්‍රදේශ සුදුසු පරිදි වැඩිකර මහජන ආරක්ෂාව සුරක්ෂිත වන පරිදි පොලිස් ස්ථාන ඇති කිරීම හා අවශ්‍ය පොලිස් නිලධාරින් යෙදවීම
12. ප්‍රජාවට පොලිසිය සමීප වන පරිදි, අවශ්‍ය සේවා ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා පොලිසිය<br>2. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | • පොලිස් ආඥාපනත (1865 අංක 16)<br>• ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44) |

## 31.0 සමෘද්ධි සංවර්ධන අමාත්‍ය

**01. විෂයපථය**

දිළිඳුබව තුරන් කරමින් ජනතාව සවිබල ගැන්වීම අරමුණු කරගත් ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක වෙමින් ජනතාව ගේ ආර්ථික මට්ටමට දියුණු කිරීම සඳහා ජීවනෝපාය මාර්ග බහුල කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව සමෘද්ධි සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික

අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. සමෘද්ධිලාභීන් ඉලක්ක කරගත් ගෘහ ආර්ථික සවිබල ගැන්වීම්, ප්‍රජා මූල වැඩසටහන්, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා සේවා පහසුකම් ශක්තිමත් කිරීම හා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම
2. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම
3. නව ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දෙන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික සහ යටිතල පහසුකම් ආදී සියල්ල ම පහසුවෙන් ලබාදෙන විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
4. සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා එක් ආයතනයක් මගින් සියලු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම හා එම ක්ෂේත්‍ර වල අගය වැඩිකිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම
5. අබාධිත තැනැත්තන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1.රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව<br>2.සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම<br>4.කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය<br>5.ග්‍රාම ශක්ති කාර්යාංශය<br>6.ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>7. ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනය<br>8.සමාජ ආරක්ෂණ මණ්ඩලය<br>9.අබාධ තැනැත්තන් සඳහා වන ජාතික සභාව<br>10.ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය<br>11.සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>12.වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | • ක්ෂුද්‍රමූල්‍ය පනත (2016 අංක 6)<br>• දිවි නැගුම පනත (2013 අංක 1)<br>• ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත (1992 අංක 41)<br>• සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත (1996 අංක 17)<br>• ආබාධ සහිත තැනැත්තන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)<br>• දිළිඳු සහන පනත (1985 අංක 32)<br>• නිවර්තන නිවාස ආඥා පනත (1907 අංක 05)<br>• දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)<br>• අයාල ආඥා පනත (1841 අංක 4)<br>• වැඩිහිටි තැනැත්තන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9) |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.